
# පාර්ලිමේන්තු විත්ති

පුවත් හසුන | 38 වැනි කාණ්ඩය | 2023 අගෝස්තු



## ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ට නවසීලන්ත පාර්ලිමේන්තුවේදී උණුසුම් පිළිගැනීමක්

සන්නිවේදන දෙපාර්තමේන්තුව - ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව




## පුවත්

- ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ට නවසීලන්ත පාර්ලිමේන්තුවේදී උණුසුම් පිළිගැනීමක්
- ශ්‍රී ලංකාවේ ඉන්දීය මහකොමසාරිස්වරයා කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා හමුවෙයි
- ජපාන NPO UNSDG මානව සම්පත් සංවර්ධන ආයතනයේ සිසුන් කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා හමුවෙය
- ශ්‍රී ලංකාවේ කොරියානු ජනරජ නව තානාපතිවරයා පාර්ලිමේන්තුවේ කථානායකවරයා හමුවෙයි
- ලාඕසයේ කොන්සල්වරිය කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා හමු වෙයි
- පාර්ලිමේන්තු ක්‍රියාදාමයට පුරවැසියන් සම්බන්ධ කරගැනීමේ විවෘත පාර්ලිමේන්තු වැඩමුළුවක් මහනුවර දී
- ශ්‍රී ලංකා - කියුබා ද්විපාර්ශ්වික සබඳතා ශක්තිමත් කර ගැනීමේ අවස්ථා පිළිබඳ අවධානය
- ප්‍රධාන ක්ෂේත්‍ර හතරක් ඔස්සේ තවදුරටත් ඉන්දීය ශ්‍රී ලංකා සබඳතා වැඩි දියුණු කිරීමට අපේක්ෂා කරනවා - ඉන්දීය මහකොමසාරිස්වරයා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හමුවෙමින් පවසයි
- උගන්ඩා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් දෙදෙනෙකු කථානායකවරයා හමුවෙයි

## කාරක සභා පුවත්

- සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව වර්තමාන අවශ්‍යතාවන්ට ගැලපෙන ආකාරයට ක්‍රියාත්මක වීමට වැඩපිළිවෙළක් සකස්කරන්න - කෝපා කමිටුවෙන් උපදෙස්
- පළාත් පාලන ආයතන තමන් විසින්ම උපයගන්නා මුදල් පිළිබඳව නිරීක්ෂණයට ලක්කිරීමට රජයේ ගිණුම් පිලිබඳ කාරක සභාවේ (කෝපා) අවධානය
- කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ දුර්වල පරිපාලනය සම්බන්ධයෙන් කෝපා කමිටුවේ දැඩි අප්‍රසාදය
- සමස්ත රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියම නවීකරණය කිරීම සඳහා ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය පිළියෙල කළ ජාතික උපාය මාර්ගික සැලැස්ම කෝප් කමිටුවට ඉදිරිපත් කරයි
- පෙර ලබා දුන් කෝප් නිර්දේශ ඉටුකිරීමේ ප්‍රගතිය පිළිබඳව වෘත්තීය පුහුණු අධිකාරියට කෝප් කමිටුවෙන් පැසසුම්
- පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පරිපාලන දුර්වලතා සහ අක්‍රමිකතා රැසක් කෝප් කමිටුවේදී හෙළි වෙයි

# අන්තර්ගතය



- ජාතික හා ජාත්‍යන්තර රැකියා වෙළඳපොළ ඉලක්ක කරගනිමින් සියලු වෘත්තීය පුහුණුආයතන හා සම්පත් ඒකරාශී කොට පොදු වැඩපිළිවෙලක් සකස් කිරීම කඩිනම් කරන්න - කෝප් අනුකමිටුව

- විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සතු බලතල පවරා ගැනීම, රාජ්‍ය නොවනවිශ්ව විද්‍යාලවලින් පිරිනමන උපාධි පාඨමාලාවල ගුණාත්මක බව පරීක්ෂා කිරීම ඇතුළු ගැටලු සඳහා මාස තුනක් තුළ විසඳුම් යෝජනා කරන්න - කෝප් කමිටුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්වරයාට නියෝග

- නිවැරදි ආර්ථික ප්‍රතිපත්තියක් ඇත්නම් වසර 10 ක් ඇතුළත මෙරට දියුණු කළ හැකියි - විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති

- ගොවීන්ගෙන් වී මිලදී ගැනීමේදී මතුව ඇති ගැටලු විසඳීමට කඩිනමින් පියවර ගන්නවා - කෘෂිකර්ම අමාත්‍ය ගරු මහින්ද අමරවීර මහතා

- වසර 50කට අධික කාලයක් හිමිකරුවන්ට ඉඩම් ඔප්පු ලබාදීමට කටයුතු නොකිරීම සම්බන්ධයෙන් සංචාරක හා ඉඩම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ අවධානය

- ආහාර සුරක්ෂිතතාවය (කෘෂිකර්ම, සත්ත්ව පාලනය සහ ධීවර කටයුතු) පිළිබඳ සංකල්පීය ප්‍රතිපත්ති රාමුව පිළිබඳ වාර්තාවේ කෙටුම්පත ජාතික සභාවට

- සීනි බදු වංචාවෙන් මෙරටට සිදුවූ පාඩුව අයකර ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ගය සම්බන්ධයෙන් රාජ්‍ය මුදල් පිළිබඳ කමිටුව මුදල් අමාත්‍යාංශයෙන් ප්‍රශ්න කරයි

- ප්‍රධාන සමාගම් ද්විත්වයට අතිරේක ලාභයක් ලැබිය නොහැකි වන පරිදි පාන්පිටි කිලෝවක විකුණුම් මිල රු.198ක් බව නිවේදනය කරන්න - මුදල් අමාත්‍යාංශයේ නිලධාරීන්ට රජයේ මුදල් පිළිබඳ කාරක සභාවෙන් උපදෙස්

- මෙරට මත්ද්‍රව්‍ය උවදුර පාලනය කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ අවධානයි

- ශ්‍රී ලංකා - එක්සත් රාජධානි පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමයේ සභාපතිවරයා ලෙස චන්දිම වීරක්කොඩි මහතා පත් කෙරේ

- ගුරු සේවයේ සිට සේවාස්ථ උපදේශක සේවයට අන්තර්ග්‍රහණය කිරීමේදී වැටුප් සම්බන්ධයෙන් ඇතිවී තිබෙන ගැටලුව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ අවධානය

- මෙරටට බස් රථ ගෙන්වීම පිළිබඳ අවම ප්‍රමිතියක් නියම කිරීමේ නිර්නායක බලශක්ති හා ප්‍රවාහනය පිළිබඳ ආංශික අධීක්ශන කාරක සභාවේදී අනුමත කෙරේ

- චීන සහ තායිලන්ත ජාතිකයින් අයථා ලෙස මෙරට මැණික් ගල් ඉතා අඩු වටිනාකමට ක්ෂේත්‍රයේදීම මිලදී ගැනීම හේතුවෙන් රජයට අපේක්ෂිත බදු මුදල් නොලැබීමේ ප්‍රවණතාවක්

- රෝගීන්ගේ අයිතිවාසිකම් හා වගකීම් වඩාත් ශක්තිමත් කිරීමට සෞඛ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවෙන් යෝජනාවලියක්

- ඉන්දියාව, බංගලාදේශය, මාලදිවයින ඇතුළු සාර්ක් කලාපීය රටවල් වෙනුවෙන් විශේෂ වීසා කාණ්ඩයක් සකස්කිරීමේ අවශ්‍යතාව පිළිබඳ ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ අවධානය.

- චිත්‍රපට කර්මාන්තය දියුණු කිරීම සම්බන්ධයෙන් ආංශික අධීක්ෂණ කාරක සභාවේදී සාකච්ඡා වෙයි.

- විවෘත සහ වගකිවයුතු රජයක් සඳහා වන ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත ගරුතර ස්වාමීන්වහන්සේලාගේ අදහස් ලබා ගනී.

- මත්පැන් බෝතල්වල ව්‍යාජ ස්ටිකර් හඳුනා ගැනීමේ ජංගම යෙදවුම කඩිනමින් ක්‍රියාත්මක කරන්න

පාර්ලිමේන්තු ඡායා ගැලරිය

# කවරයේ කතාව




නවසීලන්තයේ අධ්‍යයන චාරිකාවක නිරත වී සිටින අතරතුර මේ මස 01 වැනිදා නවසීලන්ත පාර්ලිමේන්තු රැස්වීමක් නැරඹීමට එක්වූ ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයට එහිදී උණුසුම් පිළිගැනීමක් හිමිවිය.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයයේ  සභාපතිනිය වන පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු විශේෂඥ වෛද්‍ය සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය ඇතුළු පිරිස ඉතා උණුසුම් ලෙස පිළිගන්නා බව නවසීලන්ත පාර්ලිමේන්තුවේ කථානායකවරයා පාර්ලිමේන්තුවට මෙහිදී නිවේදනය කළේය. ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයේ සාමාජිකාවන් නවසීලන්ත පාර්ලිමේන්තු කථානායකවරයාගේ විශේෂ ගැලරියේ සිට පාර්ලිමේන්තු රැස්වීම නැරඹීමට එක්වූහ. එහිදී සියළු නවසීලන්ත පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සිය අසුන්වලින් නැගිට අත්පොළසන් දෙමින් ශ්‍රී ලංකා මන්ත්‍රීවරියන් වෙත සිය ප්‍රසාදය පළ කළහ.

නවසීලන්ත පාර්ලිමේන්තුව වෙත පැමිණි ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදය පිළිගනු ලැබුවේ එරට පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය කථානායක ග්‍රේග් ඕ කොන(ර්) මහතා ඇතුළු මන්ත්‍රීවරයන් පිරිසක් විසින් නවසීලන්තයේ මාඕරි (Māori) සංස්කෘතියට අනුව ආශිර්වාද ගීතිකා ගායනා කිරීමෙනි.

අනතුරුව ශ්‍රී ලාංකික දූත පිරිස නවසීලන්ත පාර්ලිමේන්තුවේ කථානායක ඒඩ්‍රියන් රුරාවේ, නියෝජ්‍ය කථානායක ග්‍රේග් ඕ කොන(ර්) සහ සහකාර කථානායකවරියක් වන ජැකී ඩීන් යන මහත්ම මහත්මීන් සමග විශේෂ සාකච්ඡාවක නිරත වූහ.

මෙම අධ්‍යයන චාරිකාව අතරතුර නවසීලන්ත පාර්ලිමේන්තුවේ මහ ලේකම් ඩේවිඩ් විල්සන් මහතා සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මහ ලේකම් කුෂානි රෝහණදීර මහත්මිය ඇතුළු පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ සාමාජිකාවන් අතර විශේෂ හමුවක් පැවති අතර දෙරටේ පාර්ලිමේන්තුවල ක්‍රියාකාරිත්වය පිළිබඳ එහිදී දීර්ඝ වශයෙන් සාකච්ඡා කෙරිණි.

එමෙන්ම නවසීලන්ත පාර්ලිමේන්තු සේවා ප්‍රධානී රෆායෙල් ගොන්සාලෙස්, එරට කාන්තා ඇමතිනිය සහ අධ්‍යාපන අමාත්‍ය ජැන් ටිනෙට්ටි, ප්‍රජා සහ ස්වේච්ඡා අංශ පිළිබඳ අමාත්‍ය ප්‍රියංකා රාධක්‍රිෂ්ණන්, කම්කරු පක්ෂයේ සභාපති ජිල් ඩේ, එරට කාන්තාවන්ගේ නියෝජ්‍ය සභාපතිනි කැරොල් බොමන්ට්, පොදුරාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ කණ්ඩායම, වනුෂි වෝල්ටර්ස් ඇතුළු කම්කරු පක්ෂ සාමාජිකයන් ඇතුළු  මහත්මීහු පිරිසක් සමග සාකච්ඡාවන්හි නිරත වීමේ අවස්ථාවද ශ්‍රී ලාංකික මන්ත්‍රීවරියන්ට හිමි විය.

නවසීලන්ත පාර්ලිමේන්තුවේ සමාජසේවා සහ ප්‍රජා ස්ථාවර කාරක සභාවට සජීවීව සහභාගී වී එහි අත්දැකීම් ලබා ගැනීමටද සහ එරට පාර්ලිමේන්තුවේ සන්නිවේදන කණ්ඩායම විසින් පටිගත කරන ලද සම්මුඛ සාකච්ඡාවන්ට සහභාගී වීමටද ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයේ සාමාජිකාවන්ට හැකිවිය.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදය වෙනුවෙන් නවසීලන්ත පාර්ලිමේන්තුවේ නැරඹුම් චාරිකාවක්ද සංවිධානය කොට තිබිණි.

මෙම අධ්‍යයන චාරිකාවට මන්ත්‍රීවරියන්ගේ සංසදයේ සාමාජිකාවන් වන  ගරු විශේෂඥ වෛද්‍ය සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ, ගරු විශේෂඥ වෛද්‍ය  සීතා අරඹේපොල, ගරු රෝහිණී කුමාරි විජේරත්න, ගරු (නීතිඥ) පවිත්‍රාදේවී වන්නිආරච්චි, ගරු ගීතා සමන්මලී කුමාරසිංහ, ගරු (නීතිඥ) තලතා අතුකෝරල, ගරු කෝකිලා ගුණවර්ධන, ගරු මුදිතා ප්‍රිශාන්ති, ගරු රාජිකා වික්‍රමසිංහ, ගරු මංජුලා දිසානායක, ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මෙන්ම පාර්ලිමේන්තුවේ මහ ලේකම් කුෂානි රෝහණදීර, සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) ඉන්දිරා දිසානායක සහ පාර්ලිමේන්තුවේ මාධ්‍ය කළමණාකාරිනි නිම්මි හාතියල්දෙනිය යන මහත්මීහු ඇතුළු පිරිසක් සහභාගී වූහ.

මෙරට දේශපාලනය තුළ කාන්තා නායකත්වය සවිබලගැන්වීම, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සුරක්ෂිත කිරීම මෙන්ම ශ්‍රී ලාංකීය කාන්තා අභිවෘද්ධිය වෙනුවෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග වඩාත් ශක්තිමත් කිරීම අරමුණු කොට ගෙන මෙම අධ්‍යයන සංචාරය ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද නියෝජිතායතනයේ (USAID) පූර්ණ අනුග්‍රහය සහිතව ජාතික ප්‍රජාතන්ත්‍රවාදී ආයතනය (NDI) විසින් සංවිධානය කෙරිණි.






# ශ්‍රී ලංකාවේ ඉන්දීය මහකොමසාරිස්වරයා කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා හමුවෙයි



ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මහතා මේ මස 03 වැනිදා පාර්ලිමේන්තුවේදී කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා හමුවිය.

පසුගියදා ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ඉන්දීය සංචාරයේදී අවධානය යොමු වූ කරුණු පිළිබඳව ඉන්දීය මහ කොමසාරිස්වරයා මෙහිදී කථානායකවරයාට කරුණු දැක්වීය. ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර දීර්ඝ කාලීන ආර්ථික සහයෝගීතාව තහවුරු කිරීම මෙම සංචාරයේ ප්‍රධාන අරමුණ බව ද මෙහිදී මහ කොමසාරිස්වරයා පෙන්වා දුන්නේය.


එසේම මෙම සංචාරයේදී දෙරට අතර බලශක්ති අධ්‍යාපන, ඩිජිටල් තාක්ෂණ ආදි ක්ෂේත්‍රවල සහයෝගීතාව වැඩිදියුණු කිරීම පිළිබඳව සාකච්ඡා කළ බව බාග්ලේ මහතා කථානායකවරයාට දන්වා සිටියේය.

ඉන්දියාව ශ්‍රී ලංකාවට ලබා දෙන සහයෝගීතාවයට ස්තූතිය පළ කළ කථානායකවරයා මෙරටට ඉන්දියාවෙන් පැමිණෙන සංචාරකයින් සංඛ්‍යාව ඉහළ යාම පිළිබඳව සතුට පළ කළේය.

ශ්‍රී ලංකා ඉන්දියා පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමය සමග හමුවක් කැඳවන ලෙස ඉල්ලා සිටි ඉන්දීය මහ කොමසාරිස්වරයා එහි සාමාජිකයින් දැනුවත් කිරීමට අපේක්ෂා කරන බවද ප්‍රකාශ කළේයි දෙරට අතර භුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන බවද මහකොමසාරිස්වරයා පැවසීය.

මෙම රැස්වීමට පාර්ලිමේන්තුවේ වැඩබලන මහලේකම් හංස අබේරත්න මහතා ද සහභාගී විය.

# ජපාන NPO UNSDGs මානව සම්පත් සංවර්ධන ආයතනයේ සිසුන් කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා හමුවෙයි



ජපාන NPO UNSDG මානව සම්පත් සංවර්ධන ආයතනයේ සිසුන් පිරිසක් කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා පාර්ලිමේන්තුවේදී මේ මස 18 වැනිදා හමු විය.

මෙහිදී පැමිණි සිසුන් අමතමින් කථානායකවරයා සඳහන් කළේ ජපානය සහ ශ්‍රී ලංකාව අතර දීර්ඝකාලීනව විවිධ අංශ ඔස්සේ සමීප සම්බන්ධතාවයන් පවතින බවත් විශේෂයෙන්ම බෞද්ධ, සංස්කෘතික සහ අධ්‍යාපනික අංශ ඔස්සේ වැඩි වශයෙන් ශක්තිමත් සහයෝගීතාවක් පවතින බවත්ය. එසේම වර්තමානයේ මෙරට ආර්ථික අර්බුදයකට මුහුණ දී ඇති අවස්ථාවක ජපානය දක්වන මිත්‍රත්වය අගය කරන බවත් කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා පැවසීය.

පසුව ගරු කථානායකවරයාගෙන් ප්‍රශ්න විමසීමටද මෙම සිසුන්ට අවස්ථාව හිමිවූ අතර ඉන් අනතුරුව මෙම සිසුන් පාර්ලිමේන්තුවේ නිරීක්ෂණ චාරිකාවකද නිරත විය.

පාර්ලිමේන්තුවේ මහ ලේකම් කුෂානි රෝහණදීර මහත්මියද මෙම අවස්ථාව සඳහා සහභාගී වූවාය.







# ශ්‍රී ලංකාවේ කොරියානු ජනරජ නව තානාපතිවරයා පාර්ලිමේන්තුවේ කථානායකවරයා හමුවෙයි




ශ්‍රී ලංකාවේ කොරියානු ජනරජ නව තානාපති, මියොන් ලී මහත්මිය කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා මේ මස 03 වැනිදා පාර්ලිමේන්තුවේදී හමුවිය.

මෙහිදී පැවති සුහද සාකච්ඡාවේදී දෙරට අතර සබඳතාවය අංශ කිහිපයක් ඔස්සේ වැඩිදියුණු කිරීම පිළිබඳ අවධානය යොමුවූ අතර ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයට සහය දැක්වීමට දැනට සිදු කෙරෙන පර්යේෂණ හා සංවර්ධන සහය ඉදිරියටත් ලබා දෙන බවට තානාපතිවරියා අවධාරණය කළේය.

තවද, අධ්‍යාපනය, ප්‍රවාහනය, ජල කළමනාකරණය සහ සනීපාරක්ෂාව මෙන්ම ග්‍රාමීය සංවර්ධනය සඳහා KOICA ආයතනය හරහා ආධාර ලබාදීම පිළිබඳව ද මෙහිදී සාකච්ඡා කෙරිණි.

පාර්ලිමේන්තුවේ වැඩබලන මහලේකම් හංස අබේරත්න මහතා ද මෙම අවස්ථාවට එක්ව සිටියේය.





පුවත්

# ලාඕසයේ කොන්සල්වරිය කඨානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා හමු වෙයි



ලාඕස මහජන ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයේ කොන්සල්වරියවන, මනිලායි තිපලන්සි මැතිනිය කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා පාර්ලිමේන්තුවේදී මේ මස 17 වැනිදා හමු විය.

මෙහිදී දෙරට අතර සබඳතාවය අංශ කිහිපයක් ඔස්සේ වැඩිදියුණු කිරීම පිළිබඳ සාකච්ඡා කෙරිණි. විශේෂයෙන්ම දෙරට අතර බෞද්ධ සංස්කෘතික වැඩසටහන් දියුණු කිරීම පිළිබඳව සහ සංචාරක කර්මාන්තයේ දියුණුව වෙනුවෙන් ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳව සාකච්ඡා විය.

එසේම  ලාඕස මහජන ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයේ පවතින ව්‍යාපාර කටයුතු පිළිබඳව සහ එරට විසින් වෙනත් රටවල් වෙත අපනයනය කරන භාණ්ඩ සහ සේවාවන් පිළිබඳවද මෙහිදී සාකච්ඡා විය.

තවද ලාඕස මහජන ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය වෙනුවෙන් වර්තමාන නව වැනි පාර්ලිමේන්තුවේ මිත්‍රත්ව සංගමයක් පිහිටුවීම පිළිබඳවද මෙහිදී සාකච්ඡා කෙරිණි.

පාර්ලිමේන්තුවේ මහ ලේකම් කුෂානි රෝහණදීර මහත්මියද මෙම අවස්ථාව සඳහා සහභාගී වූවාය.







# පාර්ලිමේන්තු ක්‍රියාදාමයට පුරවැසියන් සම්බන්ධ කරගැනීමේ විවෘත පාර්ලිමේන්තු වැඩමුළුවක් මහනුවර දී



විවෘත පාර්ලිමේන්තුවකට මුලාරම්භයක් සඳහා වූ පාර්ලිමේන්තු සංසදය හා සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද පාර්ලිමේන්තු ක්‍රියාදාමයට පුරවැසියන් සම්බන්ධ කරගැනීමේ විවෘත පාර්ලිමේන්තු වැඩමුළුවක් දින 03ක් පුරාවට මහනුවර දී පැවැත්විණි.

මෙම වැඩමුළුව මගින් ප්‍රජාතන්ත්‍රවාදී සංකල්පය, පාර්ලිමේන්තුවේ භූමිකාව, කාර්යභාර්ය හා මහජන නියෝජිතයන්ගේ කාර්යභාරය පිළිබඳ විවෘත පාර්ලාමේන්තු සංකල්පය ඔස්සේ විවිධ ජන කොටස් දැනුවත් කිරීම සිදු කෙරුණු අතර නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධයෙන් මහජනතාව තුළ තිරසාර විශ්වාසයක් සහ අභිප්‍රේණයක් ඇති කරලීම මෙහි අරමුණ විය.

මෙම වැඩමුළුව පසුගිය ජුලි මස 15, 16, 17 තෙදිනක් පුරාවට මහනුවර ඕක් රේ රිජන්සි හෝටල් පරිශ්‍රයේදී පැවැත්වුණු අතර 15 වැනිදා තරුණ සේවා නිළධාරින්, තරුණ පාර්ලිමේන්තු නියෝජිතයන් සහ යෞවන සමාජ සාමාජිකයන් සම්බන්ධවීම සිදු විය.

16 වැනිදා ව්‍යාපාරික ප්‍රජාව, හිටපු පළාත් සභා මන්ත්‍රීවරයන් සහ මහනුවර දිස්ත්‍රික් සිවිල් සංවිධාන ක්‍රියාකාරීන් සහභාගී වූ අතර, මෙහිදී මහනුවර දිස්ත්‍රික්කයේ ස්ථාපිත සිවිල් සංවිධාන ක්‍රියාකාරීන් හා එක්ව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ විවෘත භූමිකාව, පනත් සම්මතකරණය, කමිටු ක්‍රියාවලිය පිළිබඳ සාකච්ඡා කිරීමත් සිදු විය.

17 වැනිදා වැඩමුලුව මහනුවර දිස්ත්‍රික්කයේ ශිෂ්‍ය පාර්ලිමේන්තුව නියෝජනය කරන, තෝරාගත් ශිෂ්‍ය - ශිෂ්‍යාවන් සංඛ්‍යාවක් මුලික කරගනිමින් සිදු විය. මෙම වැඩමුලුව සඳහා දින තුනම නියෝජනය කරමින් විවෘත පාර්ලිමේන්තුවකට මුලාරම්භයක් සඳහා වූ පාර්ලිමේන්තු සංසදයේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මයන්ත දිසානායක මහතා සම්බන්ධවූ අතර පැමිණ සිටි පාර්ශ්ව සමග සිය අදහස් බෙදාගැනීමද මෙහිදී සිදු විය.

එසේම මෙම වැඩමුලු සඳහා රාජ්‍ය අමාත්‍ය ගරු තාරක බාලසූරිය පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන ගරු ප්‍රේමනාත් සී දොළවත්ත, ගරු ජේ.සී. අලවතුවල, ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර, ගරු අසංක නවරත්න, ගරු උදයන කිරිදිගෙ ාඩ, ගරු රෝහන බණ්ඩාර, ගරු ඩිලාන් පෙරේරා, ගරු සුජිත් සංජය පෙරේරා සහ ගරු ගුණතිලක රාජපක්ෂ යන මහත්වරු සහභාගී වූහ.

තවද මේ සඳහා පාර්ලිමේන්තුව නියෝජනය කරමින් පාර්ලිමේන්තුවේ මහ ලේකම් කුෂාණි රෝහණදීර, සහකාර මහ ලේකම් හංස අබේරත්න සහ ව්‍යවස්ථාදායක සේවා සහ සන්නිවේදන අධ්‍යක්ෂක (වැඩබලන) ජනකාන්ත ද සිල්වා මහත්ම මහත්මීහු සහභාගී වූහ.







පුවත්

# ශ්‍රී ලංකා - කියුබා ද්විපාර්ශ්වික සබඳතා ශක්තිමත් කර ගැනීමේ අවස්ථා පිළිබඳ අවධානය



ශ්‍රී ලංකාව සහ කියුබාව අතර ද්විපාර්ශ්වික සබඳතා තවදුරටත් ශක්තිමත් කර ගැනීමේ අවස්ථාවන් පිළිබඳව මේ මස 09 වැනිදා පාර්ලිමේන්තුවේදී පැවති ශ්‍රී ලංකා කියුබා පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමයේ රැස්වීමේදී අවධානය යොමු විය.

එම සංගමයේ විධායක කමිටු රැස්වීම සංගමයේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී (මහාචාර්ය) තිස්ස විතාරණ මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා රැස්වූ අවස්ථාවේදී මේ පිළිබඳව සාකච්ඡා විය. ශ්‍රී ලංකාවේ කියුබානු තානාපති අන්ද්‍රේස් මාකෙලෝ ගරිඩෝ (Andres Marcelo Garrido) මහතා ද මේ අවස්ථාවට එක්ව සිටියේය.

ශ්‍රී ලංකාව සහ කියුබාව දීර්ඝ කාලයක සිට සෑම අවස්ථාවකදීම එකිනෙකාට සහයෝගය දක්වමින් ජාත්‍යන්තර වශයෙන් මිත්‍ර රටවල් ලෙස කටයුතු කරන බවත් මෙම ප්‍රවණතාවය තවත් වැඩි කළ යුතු බවත් බව ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා මෙහිදී පැවසීයි ශ්‍රී ලංකාවේ විවිධ පළාත්වල ශ්‍රී ලංකා කියුබා මිත්‍රත්ව සංවිධාන ආරම්භ කිරීමෙන් ශ්‍රී ලංකාවාසීන්ට කියුබාව පිළිබඳ දැනගැනීමට එය අවස්ථාවක් වනු ඇතැයි ද ඔහු පැවසීය. ඒ අනුව ශ්‍රී ලංකා කියුබා මිත්‍රත්ව සංවිධාන තම ප්‍රදේශවල ආරම්භ කිරීමට ඉදිරිපත් වන ලෙස ඔහු පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමයේ විධායක කමිටු සාමාජිකයින්ට ආරාධනා කළේය.

මෙහිදී අදහස් දැක්වූ ශ්‍රී ලංකාවේ කියුබානු තානාපති අන්ද්‍රේස් මාකෙලෝ ගරිඩෝ මහතා, කියුබානු - ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමය පසුගියදා කියුබානු පාර්ලිමේන්තුවේදී ආරම්භ කළ බවත් දෙරට අතර සබඳතා ශක්තිමත් කර ගැනීමට එහි සාමාජිකයන් උනන්දු වන බවත් පැවසීය. එමෙන්ම කියුබාව මුහුණ දුන් විවිධ අභියෝගවලදී ශ්‍රී ලංකාව ලබාදුන් සහයෝගිතාව පිළිබඳව ද ඔහු කෘතඥතාව පළ කළේය. එසේම දෙරට අතර ක්‍රීඩා, වෙළෙඳ ආදී ක්ෂේත්‍රවල ද්විපාර්ශ්වික සබඳතා වැඩිදියුණු කර ගැනීමට අවස්ථා පවතින බව පැවසූ කියුබානු තානාපතිවරයා නොවැම්බර් මස මුලදී පැවැත්වෙන හවානා ජාත්‍යන්තර ප්‍රදර්ශනයට සහභාගි වන ලෙස ශ්‍රී ලාංකික ව්‍යාපාරිකයන්ට ආරාධනා කළේය.

මෙහිදී අදහස් දැක්වූ රාජ්‍ය අමාත්‍ය ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා සඳහන් කළේ, කියුබානු රජය සමඟ එක්ව ශ්‍රී ලංකාව තුළ වෛද්‍ය විද්‍යාලයක් ආරම්භ කිරීමේ හැකියාව පවතින බවත්, මේ සඳහා වන සංකල්ප පත්‍රිකාවක් මේ වන විටත් සකස් කර අවසන් බවත් එය මිත්‍රත්ව සංගමයට ද ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන බවත් ඔහු පැවසීය.





# ප්‍රධාන ක්ෂේත්‍ර හතරක් ඔස්සේ තවදුරටත් ඉන්දීය ශ්‍රී ලංකා සබඳතා වැඩි දියුණු කිරීමට අපේක්ෂා කරනවා - ඉන්දීය මහකොමසාරිස්වරයා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හමුවෙමින් පවසයි





ආහාර සුරක්ෂිතතාව, බලශක්ති සුරක්ෂිතතාව, මූල්‍ය සහයෝගිතාව සහ දිගු කාලීන ආයෝජන යන අංශ හතර ඔස්සේ තවදුරටත් ඉන්දු - ශ්‍රී ලංකා සබඳතාව ශක්තිමත් කිරීමට අපේක්ෂා කරන බව මෙරට ඉන්දීය මහකොමසාරිස් ගෝපාල් බාග්ලේ මහතා මේ මස 23 වැනිදා පාර්ලිමේන්තුවේදී පැවසීය.



කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් මේ මස 23 වැනිදා පාර්ලිමේන්තුවේදී පැවති ශ්‍රී ලංකා ඉන්දීය පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමයේ රැස්වීමක් ආමන්ත්‍රණය කරමින් මහකොමසාරිස්වරයා මේබව පැවසීය.

ශ්‍රී ලංකා ඉන්දීය පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමය හරහා හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ඔස්සේ දෙරට අතර සබඳතා තරකර ගැනීමේ වැදගත්කම පිළිබඳව පෙන්වා දුන් කථානායකවරයා ඉන්දියාව ලබාදෙන සහය පිළිබඳ සිය කෘතවේදීත්වය පළ කළේය.



මෙහිදී ඉන්දීය විදේශ අමාත්‍ය ගරු ආචාර්ය එස්.ජයශංකර් මහතා වීඩියෝ පනිවිඩයක් මගින් දැනුම් දුන්නේ මෙරට සංවර්ධන කටයුතු සඳහා ඉන්දියාව තවදුරටත් සහය දක්වන බවයි.

ශ්‍රී ලංකා ඉන්දීය පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමයේ ලේකම් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා ඇතුළු සාමාජික මන්ත්‍රීවරු, අමාත්‍යවරු, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ඇතුළු පිරිසක් ද පාර්ලිමේන්තුවේ මහලේකම් කුෂානි රෝහණදීර මහත්මිය ද මෙම අවස්ථාවට එක්ව සිටියහ

# උගන්ඩා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් දෙදෙනෙකු කථානායකවරයා හමුවෙයි



උගන්ඩාවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන ගරු එලිජා ඔකුපා (Elijah Okupa) සහ ගරු අබ්දු කටුන්ටු (Abdu Katuntu) යන මහත්වරු කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා මේ මස 24 වැනිදා පාර්ලිමේන්තුවේදී හමු වූහ.

2024 ජනවාරි මස උගන්ඩාවේ පැවැත්වීමට නියමිත 27 වැනි පොදුරාජ්‍ය මණ්ඩලීය කථානායකවරුන්ගේ සහ මූලාසන නිලධාරීන්ගේ සමුළුවට (CSPOC) සහභාගි වන ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ගරු කථානායකවරයාට මෙහිදී ආරාධනා කළහ.

එමෙන්ම දෙපාර්ශවය මෙහිදී උගන්ඩා - ශ්‍රී ලංකා ද්විපාර්ශ්වික සබඳතා වර්ධනය කරගැනීම පිළිබඳ සුහද සාකච්ඡාවක ද නිරතවිය.



# කාරකසභා පුවත්



කාරක සභා පුවත්

# සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව වර්තමාන අවශ්‍යතාවන්ට ගැලපෙන ආකාරයට ක්‍රියාත්මක වීමට වැඩපිළිවෙළක් සකස්කරන්න - කෝපා කමිටුවෙන්

- වසර තුනහමාරකින් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට බඳවාගැනීම් සිදු කර නැහැ
- දැනට 33687 ක් සිවිල් ආරක්ෂක බලකා සේවයේ



සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව යම් ආකාරයකන් ක්‍රියාත්මක වීමේ වැඩපිළිවෙළක් සකස්කරන ලෙස කෝපා කමිටුවේ සභාපති රාජ්‍ය අමාත්‍ය ගරු ලසන්ත අලගියවන්න මහතා එම දෙපාර්තමේන්තුවට උපදෙස් ලබාදුන්නේය.

රාජ්‍ය අමාත්‍ය ගරු ලසන්ත අලගියවන්න මහතා මෙම උපදෙස් ලබාදුන්නේ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 2019/2020/2021 වර්ෂවල විගණකාධිපති වාර්තා සහ වර්තමාන කාර්යසාධනය පිළිබඳ පරීක්ෂාකිරීම සඳහා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව ඒ මහතාගේ සභාපතිත්වයෙන් මේ මස 08 වැනිදා පාර්ලිමේන්තුවේදී රැස් වූ අවස්ථාවේදී ය.

එසේම සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව සම්බන්ධව රාජ්‍ය ප්‍රතිපත්යට ගැලපෙන ලෙස ඉදිරි කටයුතු කිරීම පිළිබඳව නීතිමය රාමුවක් සැකසීම සම්බන්ධයෙන් සැප්තැම්බර් 11 දිනට පෙර දින වකවානු සහිත වාර්තාවක් කෝපා කමිටුවට ලබාදෙන ලෙස ලසන්ත අලගියවන්න මහතා නිර්දේශ කළේය.

මෙහිදී පැමිණ සිටි නිලධාරීන් පෙන්වා දුන්නේ වසර තුනහමාරකින් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට බඳවාගැනීම් සිදු කර නැති බවත් සිවිල් ආරක්ෂක බලකාය ක්ෂයවීමේ හමුදාවක් ලෙස මේ වන විට නම් කොට ඇති බවත්ය. එසේම සිවිල් ආරක්ෂක බලකාය සතුව මේ වන විට 33687 ක් සේවය කරන බවද පැමිණ සිටි නිලධාරීහු පෙන්වා දුන් අතර එම පිරිස අනුයුක්ත කොට ඇති ස්ථාන සහ සේවාවන් පිළිබඳවද සඳහන් කළේය.

එසේම මෙහිදී ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් කමල් ගුණරත්න මහතා විසින් මෙම බලකාය පිහිටුවීම පිළිබඳව සහ එහි කටයුතු සිදුවූ ආකාරය පිළිබඳව පැහැදිලි කිරීම සිදු කළේය.

තවද අවශ්‍යතාව ඉක්මවා සිදු කළ මිලදීගැනීම් පිළිබඳව, මෙම දෙපාර්තමේන්තුව විසින් සිදු කළ ව්‍යාපෘති පිළිබඳව සහ මෙම බලකාය විසින් වගාකළ ධාන්‍ය, අස්වැන්න විකිණීම පිළිබඳවද මෙහිදී සාකච්ඡා කළේය.





# පළාත් පාලන ආයතන, තමන් විසින්ම උපයගන්නා මුදල් පිළිබඳව නිරීක්ෂණයට ලක්කිරීමට රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ (කෝපා) අවධානය



පළාත් පාලන ආයතන විගණනයට ලක් වුවත්, එම ආයතන තමන් විසින්ම උපයගන්නා මුදල් පිළිබඳව මෙතෙක් විගණයට ලක් නොවූ බව රජයේ ගිණුම් පිළිබද කාරක සභාවේ සභාපති, රාජ්‍ය අමාත්‍ය ගරු ලසන්ත අලගියවන්න මහතා පවසයි.

ඒ අනුව එලෙස විගණයට ලක් නොවන අංශ ද විගණනයට ලක් කිරීමට රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ (කෝපා) අවධානය යොමුව තිබෙන බව සභාපතිවරයා ප්‍රකාශ කළේය.

සභාපතිවරයා ඒ අදහස් පලකළේ මේ මස 29 වැනිදා පාර්ලිමේන්තුවේදී, 2019/2020 යන වර්ෂයන් සඳහා සතුටුදායක කාර්ය සාධන මට්ටමක් ළඟා කරගත් රාජ්‍ය ආයතන ඇගයීම සඳහා සහතිකපත් ප්‍රදානය කිරීමේ අවස්ථාවට සහභාගී වෙමිනි.

එහිදී වැඩි දුරටත් අදහස් දක්වමින් සභාපතිවරයා ප්‍රකාශ කළේ, 2004 වර්ෂයේ ඔහු පාර්ලිමේන්තුවට පැමිණෙන විට ඇතැම් රාජ්‍ය ආයතනවල 1980 දශකයට අදාළ වාර්ෂික වාර්තා පවා ඉදිරිපත් වූ බවයි. එහෙත් මෙම කමිටුවල ප්‍රතිඵලයක් ලෙස මේ වන විට ආයතන ගණනාවක් විධිමත් ලෙස ක්‍රියාත්මක වන බව ද අලගියවන්න මහතා පෙන්වා දුන්නේය.

මෙහිදී අදහස් දක්වමින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සමාජික, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු වජිර අබේවර්ධන මහතා සඳහන් කළේ රජය ගෙනයන වැඩ පිළිවෙල පිළිබඳව ලෝක මුල්‍ය සංවිධාන සතුට පළකර ඇති බවයි. රාජ්‍ය යාන්ත්‍රණය හා දේශපාලන යාන්ත්‍රණය එක්ව කටයුතු කිරීම වැදගත් බවද මන්ත්‍රීවරයා මෙහිදී සිහිපත් කළේය.

එමෙන්ම රට බංකලොත් යැයි ප්‍රකාශයට පත්කර ඇති බැවින් ඉන් රට මුදවා ගැනීමටල සකස් කර ඇති නීති රීති ක්‍රියාත්මක කිරීමට හා ඒවා සුරැකීමට කැපවිය යුතු බවද අවධාරණය කළේය.

රජයේ විගණකාධිපති ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න මහතා අදහස් දක්වමින් සඳහන් කළේ රාජ්‍ය ආයතන හා ආයතන ප්‍රධානීන් තවදුරටත් තම ආයතන වලට වග කියන ආකාරයට නීති ශක්තිමත් විය යුතු බවයි.

2019/2020 යන වර්ෂයන් සඳහා සතුටුදායක ලකුණු ලබාගත් රාජ්‍ය ආයතන අගයමින් සහතිකපත් 113ක් ලබා දීම මෙහිදී සිදු කෙරිණි.

බස්නාහිර පළාත තුල රාජ්‍ය ආයතන 45ක්සඳහා ගරු සභාපති තුමන් හා අනෙකුත් සමාජික මන්ත්‍රීවරුන් හා නිලධාරීන් අතින් සහතික පත් ලබා දීම සිදු කෙරුණු අතර මාර්ග ගත ක්‍රමය ඔස්සේ  අනෙකුත් පළාත් වල රාජ්‍ය ආයතන 60ක් සඳහා සහතික පත් ලබා දීම සිදු විය.





කාරක සභා පුවත්

# කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ දුර්වල පරිපාලනය සම්බන්ධයෙන් කෝපා කමිටුවේ දැඩි අප්‍රසාදය

●රේඩාර් පද්ධතියක් ඉදිකිරීම වෙනුවෙන් සිදුකළ අසාර්ථක ව්‍යාපෘතියක් නිසා රු.මිලියන 78ක අලාභයක්



ලෝක කාලගුණ විද්‍යා සංගමය මගින් ලබා දුන් රේඩාර් පද්ධතියක් ගොන්ගල ප්‍රදේශයේ ඉදිකිරීම වෙනුවෙන් සිදුකළ අසාර්ථක ව්‍යාපෘතියක් නිසා රු.මිලියන 78ක අලාභයක් රජයට සිදුවී ඇති බව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේදී (කෝපා කමිටුව) මේ මස අනාවරණය විය.

රාජ්‍ය අමාත්‍ය ගරු ලසන්ත අලගියවන්න මහතාගේ ප්‍රධානත්වයෙන් 2023.08.10 වන දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට 2019,2020 සහ 2021 වසරවල විගණකාධිපති වාර්තා සහ වත්මන් කාර්යසාධනය පිළිබඳ පරීක්ෂාව සඳහා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව කැඳවා තිබූ අවස්ථාවේදී මෙම කරුණු අනාවරණය විය.

2008 වසරේ ක්‍රියාත්මක කර ඇති මෙම ව්‍යාපෘතියේදී මෙම රේඩාර් පද්ධතිය සඳහා රු.මිලියන 402ක් වියදම් කර ඇති බවත් ලෝක කාලගුණ විද්‍යා සංගමය මගින් ඉන් රු. මිලියන 323ක් ලැබී ඇති බවත් මෙහිදී හෙළිවිය. මෙම ව්‍යාපෘතිය මෙරටට රැගෙන ඒමට පෙර කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරියෙක් මෙම යන්ත්‍රය පරීක්ෂාකර බලා මෙය ක්‍රියාත්මක තත්ත්වයේ නැති බැවින් මෙරටට රැගෙන නොඑන ලෙස දැනුම්දී ඇති බවත් හෙළිවිය. අදාළ ස්ථානයට මාර්ගයක් සකස් කිරීම වෙනුවෙන් වසර ගණනාවක් ගතව ඇතිබවත් එහිදී මෙම උපකරණ යල්පැනගිය තත්ත්වය පත්ව ඇති බවත් විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීහු පැවසූහ. අනතුරුව මෙය රැගෙන යන දොඹකරය හා මාර්ගය කඩාවැටීම නිසා යම් උපකරණ ප්‍රමාණයක් විනාශ වී ඇති බවත් ඉතිරි උපකරණ අස්ථානගතවී ඇති බවත් ඔවුහු පෙන්වා දුන්හ.මේ සම්බන්ධයෙන් පොලිස් පරීක්ෂණ සහ අල්ලස් හා දූෂණ විමර්ශන කොමිෂන් සභාව මගින් පරීක්ෂණයක්ද ක්‍රියාත්මක බවත් අනාවරණය විය.

මේ අනුව විශාල අලාභයක් ද සිදුකර සම්පූර්ණයෙන් අසාර්ථක වී ඇති මෙවැනි ව්‍යාපෘති වෙනුවට නවීන තාක්ෂණය සමග කාලගුණ විද්‍යා දෙපාර්මේන්තුව නිවැරදි අනාවැකි ඉදිරිපත්කිරීමට ඵලදායි ව්‍යාපෘති කඩිනමින් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව කමිටුව විසින් අවධාරණය කරන ලදී.

පවතින නියං තත්ත්වය පිළිබඳ නිවැරදි අනාවැකි යොමු නොකිරීම පිළිබඳව පවතින වාර්තා සම්බන්ධයෙන් මෙහිදී විමසීම් කළහ.මෙහිදී අධ්‍යක්ෂ ජනරාල්වරයා පවසා සිටියේ පසුගිය අප්‍රේල් මාසයේදී වාරිමාර්ග දෙපාර්තමේන්තුව, මහවැලි අධිකාරිය ඇතුළු අදාළ රාජ්‍ය ආයතන ඇතුළු කලාපීය රටවල් සමග පවත්වන ලද මෝසම් කතිකාව නම් සාකච්ඡාවේදී මේ පිළිබඳව දැනුම් දුන් බවයි. එහෙත් කමිටුව පෙන්වා දුන්නේ මෙම අදාල ආයතන විසින් මේ සම්බන්ධ තොරතුරු තමන් වෙත ලබා නොදුන් බව පැවසිය හැකි නිසා පනතක් මගින් නෛතික තත්ත්වය සකසන තුරු කැබිනට් තීරණයක් මගින් හෝ අදාළ සියලු ආයතන සමග ඒකාබද්ධ යාන්ත්‍රණයක් සකස් කරන ලෙසයි මසක් තුළ මේ සම්බන්ධව කෝපා කමිටුවට වාර්තා කරන ලෙසත් උපදෙස් දෙන ලදී.

එසේම පළකළ අනාවැකිවල සාර්ථකවීමේ ප්‍රගතිය පිළිබඳ දත්ත තිබේදැයි විමසන ලදී. නමුත් එවැනි වැඩපිළිවෙලක් නොමැති බව හෙළිවූ අතර ලොව අනෙකුත් රටවල තත්ත්වයද සලකා බලා විධිමත් වැඩපිළිවෙලක් කඩිනමින් සකසා මසක් ඇතුළත වාර්තා කරන ලෙස උපදෙස් දුන්නේය.

වර්ෂාමාන 453ක් පිහිටුවා තිබියදී ඉන් 73ක් අක්‍රියව පැවතීම පිළිබඳ අවධානය යොමු විය. එසේම 2018 වසරේදී ස්වයංක්‍රිය වර්ෂාමාන 122 ක් ස්ථාපිත කර තිබුණද බැටරි ක්‍රියාත්මක නොවීම වැනි කරුණු නිසා දැනට 70ක් ක්‍රියාත්මක නොවීම පිළිබඳව මෙහිදී විශේෂ අවධානය යොමුවියි මෙම වර්ෂාමාන නිසි පරිදි ස්ථාපිත කොට ක්ෂණිකව දත්ත ලබා ගත හැකි වැඩපිළිවෙලක් මසක් තුළ ඉදිරිපත් කරන ලෙස දෙපාර්තමේන්තුවට දැනුම් දුන්නේය.

දෙපාර්තමේන්තුව සතුව විගණන නිලධාරියෙක් නොමැති බැවින් විගණන කමිටු පවත්වා නැතිබවද හෙළිවිය. රාජ්‍ය ආයතනවල කාර්යක්ෂමතාව මැන බැලීමේ කෝපා කමිටු වැඩපිළිවෙලේ අවම ලකුණු ලබාගත් ආයතනයක් ලෙස ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පවතින කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව පවතින බව පෙන්වා දුන් කමිටු සභාපතිවරයා ආයතනයේ දුර්වල පරිපාලනය පිළිබඳ දැඩි අප්‍රසාදය පළ කළේය. එබැවින් පරිපාලන ගැටලු කඩිනමින් විසඳා ගැනීමට මීට වඩා අමාත්‍යාංශයේ මැදිහත්වීම සිදුකරන ලෙසත් ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාට කමිටු සභාපතිවරයා විසින් උපදෙස් දෙන ලදී.

කාරක සභා පුවත්

# සමස්ත රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියම නවීකරණය කිරීම සඳහා ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය පිළියෙල කළ ජාතික උපාය මාර්ගික සැලැස්ම කෝප් කමිටුවට ඉදිරිපත් කරයි





පාර්ලිමේන්තු මන්ත්‍රී මහාචාර්ය ගරු රංජිත් බණ්ඩාර මහතාගේ සභාපතීත්වයෙන් මේ මස 22 වැනිදා රැස්වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට (කෝප් කමිටුව) ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය කැඳවා තිබිණි.

මෙහිදී 2023 මාර්තු 24 වැනි දින පැවති කෝප් කමිටු රැස්වීමේදී ලබා දුන් නිර්දේශයකට අනුව සමස්ත රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියම නවීකරණය කිරීම සඳහා ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය විසින් පිළියෙල කළ ජාතික උපාය මාර්ගික සැලැස්ම කමිටුවට ඉදිරිපත් කිරීම සිදුවිය.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් නිහාල් රණසිංහ, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සම්පත් අමරතුංග,ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ උපකුලපති ජේෂ්ඨ මහාචාර්ය එම් පත්මලාල් යන මහත්වරු ඇතුළු පිරිසක් මෙම අවස්ථාවට කැඳවා තිබිණි.

රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියම නවීකරණය කිරීම සඳහා ජාතික උපාය මාර්ගික සැලැස්මක් සකස් කිරීමේ වගකීම ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයට භාරදීම සිදුවූයේ කළමනාකරණය සඳහා කීර්තිමත් නාමයක් සහිතවූ බැවින් සහ එය පාර්ලිමේන්තුව විසින් එම විශ්ව විද්‍යාලයට ලබාදුන් ගෞරවයක් ලෙස සැලකිය යුතු බව කමිටු සභාපතිවරයා පැවසීය. එසේම මෙම කටයුත්ත සඳහා කැපවූ අධ්‍යාපන අමාත්‍යාංශයටත්, ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ උපකුලපතිතුමා ප්‍රමුඛ පාලක මණ්ඩලයටත්, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවටත්, ජේෂ්ඨ මහාචාර්ය දිසා බණ්ඩාර මහතා ප්‍රමුඛ කණ්ඩායමටත් විශේෂ ස්තූතිය පුදකරන බව ද කමිටු සභාපතිවරයා සඳහන් කළේය.

එක් එක් විශ්ව විද්‍යාලවලට අනන්‍යවූ වෙනම තත්ත්වයන් ඇති බැවින් ඒ සියලු දේ කෙරෙහි අවධානය යොමු කරමින් මෙම කෙටුම්පත අනුව කටයුතු කිරීමේ හැකියාව ඇති බව ජේෂ්ඨ මහාචාර්ය දිසා බණ්ඩාර මහතා පෙන්වා දුන්නේය.

මෙරට විශ්ව විද්‍යාල පද්ධතිය කඩාවැටීමේ අවධානමකට ලක්ව ඇති පසුබිමක සති දෙකක් තුළ කාර්ය සාධක බලකායක් පත් කොට මේ සම්බන්ධ වාර්තාවක් ලබා දෙන ලෙස අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්වරයාට කාරක සභාවට දැනුම් දුන්නේය.

ඇතැම් කුඩා ශිෂ්‍ය කණ්ඩායම්වලට සමස්ත විශ්වල පද්ධතියම කඩා වැට්ටවීම සඳහා ඉඩ නොදිය යුතු බවටත් කෝප් සභාපතිවරයා කරුණු පෙන්වා දුන්නේයි එසේම විශ්ව විද්‍යාලවල ගුණාත්මක බව පවත්වා ගැනීමට ප්‍රතිපාදන කොමිෂන් සභාවට ද වගකීමක් පවතින බවත් කෝප් සභාපතිවරයා පැවසීය.

එසේම මෙරට විශ්ව විද්‍යාලවලින් 50%ක් පමණ හෝ පර්යේෂණ විශ්ව විද්‍යාල බවට පත්විය යුතු බවත් මහාචාර්ය රංජිත් බණ්ඩාර මහතා පෙන්වා දුන්නේය.

විශ්ව විද්‍යාල ආචාර්යවරු 12992 ක් සිටිය යුතු වුවද මේවන විට සේවයේ නියුක්ත වන්නේ ආචාර්යවරු 6548ක් බව ප්‍රතිපාදන කොමිෂමේ සභාපතිවරයා පැවසීය. එසේම අනධ්‍යයන කාර්ය මණ්ඩලයේද මෙම තත්ත්වය දැකිය හැකි බැවින් මෙය විසඳාගැනීමට කටයුතු කළ යුතු බවත් පෙන්වා දුන්නේය. එසේම මෙරට ආර්ථික අර්බුදය සමග ආචාර්ය මහාචාර්යවරු රට හැර යාම ගැටලුවක් බවට පත්ව ඇති බවත් අවම වශයෙන් 1000ක ආචාර්යවරු ප්‍රමාණයක් බඳවා ගත යුතු බවත් වි.වි. ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයා පැවසීය.

කාරක සභා පුවත්

# පෙර ලබා දුන් කෝප් නිර්දේශ ඉටුකිරීමේ ප්‍රගතිය පිළිබඳව වෘත්තීය පුහුණු අධිකාරියට කෝප් කමිටුවෙන් පැසසුම්

- දෙස් විදෙස් රැකියා වෙළඳපොළ ඉලක්ක කර ගනිමින් සිසුන් 35000ක් මේ වසර තුළ බඳවාගෙන ඇති බව අනාවරණය වෙයි
- රැකියා වෙළඳපොළදට ගැළපෙන පරිදි නව පාඨමාලා ආරම්භ කිරීමට නිර්දේශ
- උපදේශකවරුන්ගේ වැටුප් වැඩිකර ඒ සඳහා සුදුසුකම් සහිත පිරිසක් ආකර්ෂණය කරගැනීමටත් පියවර ගන්නා ලෙස නියෝග

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතාගේ සභාපතිත්වයෙන් මේ මස 09 වැනි දින රැස්වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට (කොප් කමිටුව) ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය කැඳවා තිබූ අතර 2023 මාර්තු 23 සහ 2023 මැයි 9 දිනයන්හි පැවති කෝප් කමිටු නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සමාලෝචනය කිරීම සිදුවිය.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් නිහාල් රණසිංහ, වෘත්තීය පුහුණු අධිකාරියේ සභාපති එයාර් වයිස් මාෂල් (විශ්‍රාමික) ප්‍රසන්න රණසිංහ යන මහත්වරු ඇතුළු පිරිසක් මෙම අවස්ථාවට කැඳවා තිබිණි.

කාරක සභා රැස්වීම ආරම්භයේදීම කෝප් සභාපතිවරයා විසින් වෘත්තිය පුහුණු අධිකාරිය පෙර කෝප් රැස්වීම්වල ලබා දුන් නිර්දේශවලට අනුකූලව ලබා ඇති ප්‍රගතිය පිළිබඳව සිය ශුභාසිංශන පළ කර සිටියේයි අනතුරුව පහත සඳහන් කරුණු පිළිබඳව අවධානය යොමුවිය.

**අධිකාරියේ සංයුක්ත සැලැස්ම**

අධිකාරියේ සංයුක්ත සැලැස්ම සකස් කිරීම සඳහා මූලික වැඩමුළුවක් පැවත්වීමෙන් අනතුරුව 2023-2027 වසර සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කළ බවත් ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමතිය හිමිවී වූ බවත් අධිකාරියේ සභාපතිවරයා සඳහන් කළේය.



**අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු අනෙකුත් තනතුරුවල පුරප්පාඩු**

ආයතනයේ පුරප්පාඩු වී ඇති අධ්‍යක්ෂ ජනරාල් ධුරය පිරවීම සඳහා පියවර ගෙන ඇති බවත් ඒ සඳහා සම්මුඛ පරීක්ෂණය ඉදිරියේදී පැවැත්වෙන බවත් අනාවරණය විය් එසේම මේවන විට බඳවා ගැනීම් සඳහා අනුමැතිය ලබා දීමේ බලය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට නැවත පවරා ඇති බැවින් ඉතිරි ප්‍රධාන තනතුරු 6 සහ අනෙකුත් පුරප්පාඩු පිරවීම සඳහා කඩිනමින් අවශ්‍ය පියවර ගන්නා ලෙස දැනුම් දුන්නේය.




**රැකියා වෙළඳපොළ ඉක්කකර සිසුන් බඳවා ගැනීම**

දෙස් විදෙස් රැකියා වෙළඳපොළ ඉලක්ක කර ගනිමින් මේ වන විට සිසුන් 35000ක් මේ වසර තුළ බඳවාගෙන ඇති බව අධිකාරියේ සභාපතිවරයා පැවසීය. එසේම දැනටමත් කුසලතාව සහිත ශ්‍රමිකයන්ට එය වැඩි දියුණු කොට ජාත්‍යන්තර පිළිගැනීමක් සහිත සහතිකයක් නිකුත් කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකස් කරන ලෙසද නිර්දේශ කෙරිණි.

දකුණු කොරියාව, ඕමානය ඇතුළු රටවලින් ලැබෙන රැකියා ඉල්ලුමට අනුව කටයුතු කරන බවත් රැකියා ඉල්ලුම වැඩි ක්ෂේත්‍ර සඳහා වැඩි අවධානයක් යොමුකරන බවත් අධිකාරියේ සභාපතිවරයා සඳහන් කළේය. විදේශ සේවා නියුක්ති කාර්යාංශය සමග ගිවිසුමක් මේ වන විට පවතින බවත් පුහුණු ශ්‍රමිකයන් 2000කට ආසන්න ප්‍රමාණයක දත්ත ලබා දී ඇති බවත් අනාවරණය විය.

පාසැල් අතහැරයන තරුණ පිරිසට නිසි වෘත්තිය පුහුණුවකට යොමුකිරීමේ අවශ්‍යතාව කෝප් සභාපතිවරයා අවධාරණය කරන ලදී. මේ සඳහා නව වැඩපිළිවෙලක් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ආරම්භකර ඇති බවත් මෙහි නියමු ව්‍යාපෘතිය පසුගියදා මහනුවර ධර්මරාජ විද්‍යාලයේ පැවති බවත් අනාවරණය විය.

ඒ අනුව රැකියා වෙළඳපොළදට ගැළපෙන පරිදි නව පාඨමාලා ආරම්භ කිරීම සඳහා නිර්දේශ කෙරිණි.

**පාඨමාලා උපදේශකවරුන්ගේ වැටුප් ඇතුළු ගැටලු**

මෙම ආයතන භාණ්ඩාගාරය මගින් නඩත්තු වීම වෙනුවට ස්වයං ආදායම් උත්පාදන තත්ත්වයට පත්වීමේ අවශ්‍යතාව කමිටුව අවධාරණය කරන ලදී.(Fee Levying system) එසේම උපදේශකවරුන්ට සිදුකරන ගෙවීම් ප්‍රමාණවත් නොවන බැවින් උපදේශවරුන් සේවය අතහැර යාම ඇතුළු ගැටලු පිළිබඳව අවධානය යොමුවිය. මේ අනුව පහත නිර්දේශ ලබා දීම සිදුවිය.

- **උපදේශකවරුන්ගේ වැටුප් වැඩිකර ඒ සඳහා සුදුසුකම් සහිත පිරිසක් ආකර්ෂණය කරගැනීමට කටයුතු කිරීම**
- **උපදේශකවරුන්ගේ ගෙවීම් වැඩිකිරීම සඳහා අධිකාරිය විසින්ම පාඨමාලා හරහා අයකරගනු ලබන මුදල් භාවිතා කිරීම (**Fee Levying system**)**
- **උපදේශකවරුන් පුහුණු කිරීම සඳහා නව වැඩපිළිවෙලක් ආරම්භ කිරීම සහ ඔවුන්ට යම් වෘත්තීමය සුදුසුකමක් ලබාදීම.**

**උපදේශකවරුන්ගේ ගෙවීම් වැඩිකරගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කොට අවශ්‍ය පියවර ගන්නා ලෙස ද කෝප් සභාපතිවරයා උපදෙස් ලබා දුන්නේය.**








# පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පරිපාලන දුර්වලතා සහ අක්‍රමිකතා රැසක් කෝප් කමිටුවේදී හෙළි වෙයි

- ඉදිකිරීම්වල සිදුවී ඇති අක්‍රමිකතා, දූෂණ සහ වංචා සෙවීමට අමාත්‍යංශ ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් තෙමසක් ඇතුලත වාර්තාවක් කැඳවයි
- විගණන කමිටුව වර්ජනය කල අනධ්‍යයන විධායක නිලධාරීන්ගේ මතයට කමිටුවේ විශේෂ සවන්දීමක්
- විශ්ව විද්‍යාල පාලක මණ්ඩලයට රජයේ මුල්‍ය රෙගුලාසි උල්ලංඝනය කිරීමට නොහැකිබව අවධාරණය කෙරේ
- ගිවිසුම් කඩකළ ආචාර්යවරු 63 කගෙන් රු. මිලියන 25 ක් අයකර ගැනීමට කඩිනම් පියවර ගන්නා ලෙස නියෝග
- මියගිය මහාචාර්යවරියකගේ ස්වාමියාට රු. මිලියන 7කට අධික මුදලක් නීති විරෝධී ලෙස ගෙවීම පිළිබඳ වහාම පියවර ගන්නැයි නියෝග
- ශාරීරික අධ්‍යාපන දෙපාර්තමේන්තු අධ්‍යක්ෂවරයා රු. මිලියන 3.2 ක් අයථා පරිහරණය කිරීම සම්බන්ධයෙන් කඩිනම් පියවර ගැනීමටත් උපදෙස්
- තවත් පරිපාලන දුර්වලතා සහ අක්‍රමිකතා රැසක්
- විශ්ව විද්‍යාල පරිපාලනය ශක්තිමත් කිරීමේ අවශ්‍යතාව කමිටුවේදී අවධාරණය කෙරේ
- මාස හයකින් නැවත කැඳවීමක්



පාර්ලිමේන්තු මන්ත්‍රී මහාචාර්ය ගරු රංජිත් බණ්ඩාර මහතාගේ සභාපතීත්වයෙන් මේ මස 08 වැනි දින රැස්වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට (කොප් කමිටුව) පේරාදෙණිය විශ්ව විද්‍යාලය කැඳවා තිබිණි.

මෙහිදී 2023 මාර්තු 22 වැනි දින පැවති කෝප් කමිටු රැස්වීමේදී ලබා දුන් පහත සඳහන් නියෝග ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සමාලෝචනය කිරීම මෙන්ම වත්මන් විගණන විමසුම් පිළිබඳවද අවධානය යොමු විය.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් නිහාල් රණසිංහ, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති ජ්‍යෂ්ඨ මහාචාර්ය සම්පත් අමරතුංග, පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ උපකුලපති මහාචාර්ය එම්.ඩී. ළමාවංශ යන මහත්වරු ඇතුළු පිරිසක් මෙම අවස්ථාවට කැඳවා තිබිණි.

**ඉදිකිරීම්වල සිදුවී ඇති අක්‍රමිකතා, දූෂණ සහ වංචා සෙවීමට අමාත්‍යංශ ලේකම් වරයාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් තෙමසක් ඇතුලත වාර්තාවක් කැඳවයි**

විශ්ව විද්‍යාලය තුළ සිදුකරන ලද ඉදිකිරීම්වලදී අක්‍රමිකතා සිදුව ඇති බවට විගණන විමසුම් පවතින බැවින් එම වංචා දූෂණ සෙවීම සඳහා අමාත්‍යංශ ලේකම් වරයාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කරන ලෙස කෝප් සභාපතිවරයා නියෝග කළේය. එසේම තෙමසක් ඇතුලත ඒ සම්බන්ධ වාර්තාවක් කෝප් කමිටුවට ලබා දෙන ලෙසටත් උපදෙස් ලබාදීම සිදුවිය.

**අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ විධායක නිලධාරීන් විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම සඳහා සහභාගී වීම පැහැර හැරීම**

විගණන සහ කළමනාකරණ කමිටුව වර්ජනය කළ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ විධායක නිලධාරීන්ගේ අදහස් විමසීමට කමිටුව විසින් අවස්ථාව ලබාදෙන ලදී. හිටපු කමිටු සභාපතිවරයෙකු විසින් අනධ්‍යයන කාර්ය මණ්ඩලයට අපහාසාත්මක අයුරින් සැලකීමේ තත්ත්වයක් මුල් කරගනිමින් මෙම රැස්වීම් වර්ජනය කර ඇති බව මෙහිදී අනාවරණය විය. කමිටු සාමාජික මන්ත්‍රීවරු පෙන්වා දුන්නේ මෙවැනි සිද්ධි කෝප් කමිටුවේ සාකච්ඡා කිරීමට තරම් නොවන බවත් විශ්ව විද්‍යාල පරිපාලනය විසින්ම ඍජු 4ක්‍රියාමාර්ග ගෙන විසදාගත යුතු බවයි. එසේම මෙය වැරදි පූර්වාදර්ශයක්ද වියහැකි බැවින් මේ වර්ජනය පිළිබඳව ගන්නා ක්‍රියාමාර්ග වාර්තා කරන ලෙසත් දැනුම් දුන්නේය. එසේම ඉදිරියේදී භාණ්ඩාගාර නියෝජිතයෙකු පත්වීමට නියමිත බැවින් විගණන සහ කළමනාකරණ කමිටුවේ ප්‍රධානියා ලෙස ඔහුව පත්කිරීමට ක්‍රියාමාර්ග ගන්නා ලෙසත් නියෝග කළේය.

ගිවිසුම් කඩකළ ආචාර්යවරුන් සම්බන්ධව පියවර ගැනීම
පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අදාළව උසස් අධ්‍යාපනය සඳහා විදේශීය විශ්ව විද්‍යාලවලට යොමුව ගිවිසුම් කඩකළ

විශ්වවිද්‍යාල ආචාර්යවරු 63 කගෙන් අයවිය යුතු රු. මිලියන 25 ක මුදලක් සම්බන්ධයෙන් මෙහිදී අවධානය යොමුවිය.මේ වන විට මෙම ආචාර්යවරු සම්බන්ධයෙන් කිසිදු තොරතුරක් නැති බවද හෙළිවිය.මෙම සිදුවීම් 2010 ට පෙර සිදුවූ බවත් මේ වන විට මෙවැනි අඩුපාඩු සිදුනොවන ලෙස ගිවිසුම් ශක්තිමත් කිරීමට පියවර ගෙන ඇති බවත් විවි ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයා පැවසීය. එසේම ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයට අදාළ ආචාර්යවරයෙක් කූඨ ලේඛන සකසා විදෙස්ගතව ගිවිසුම් කඩකර ඇති බවද මෙහිදී අනාවරණය විය.එසේම 2010න් පසුවද ගිවිසුම් කඩකළ වැඩිම ආචාර්යවරු පිරිසක් ඇත්තේද (122) පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ බව හෙළි විය. මේ සම්බන්ධයෙන් ගනු ලබන තීරණ සම්බන්ධයෙන් කමිටුවට වාර්තා කරන ලෙස විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති වරයාට නියෝග කෙරිණි.

**අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය ඇඟිලි සළකුණු යන්ත්‍රයේ පැමිණීම සටහන් නොකිරීම**

අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලයේ ඇතැම් පිරිස් ඇඟිලි සළකුණු යන්ත්‍රයේ පැමිණීම සටහන් නොකිරීම සම්බන්ධව අවධානය යොමුවිය. ඇඟිලි සළකුණු යන්ත්‍රයේ පැමිණීම සටහන් කිරීම අනිවාර්ය කරමින් චක්‍රලේඛයක් නිකුත් කරන ලෙසත් ඒ පිළිබඳ ප්‍රගතිය සති දෙකක් තුළ වාර්තා කරන ලෙසත් වි.වි.ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයාට නියෝග කරන ලදී.

**ශාරීරික අධ්‍යාපන දෙපාර්තමේන්තු අධ්‍යක්ෂවරයා රු.මිලියන 3.2 ක් අයථා පරිහරණය කිරීම**

මෙම සිදුවීමට අදාළ පුද්ගලයන් දෙදෙනෙක්ගේ වැඩ තහනම් කර ඇති බවත් එක් පුද්ගලයෙකු විදේශ ගතව ඇති බවත් අනාවරණය විය.මෙම පුද්ගලයන් සේවයෙන් පහකර මේ සම්බන්ධයෙන් නෛතික පියවර ගැනීමට පොලිසියට පැමිණිලි කර ඇති බවත් හෙළිවිය. මෙම මුදල් අයකරගැනීමටත් වැරදි කළ පුද්ගලයන්ට උපරිම දඬුවම් ලබා දීමේ අවශ්‍යතාවත් කමිටුව අවධාරණය කරන ලදී.




**මියගිය මහාචාර්යවරියකගේ ස්වාමියාට රු මිලියන 7කට අධික මුදලක් නීති විරෝධී ලෙස ගෙවීම**

විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයේ සේවය කොට මියගිය මහාචාර්යවරියකට හිමි රු මිලියන 7 කට ආසන්න මුදලක් ව්‍යාජ ලේඛන සකසා විශ්ව විද්‍යාලයේ සේවයේ නියුතු ඇයගේ ස්වාමිපුරුෂයා වෙත ගෙවීම සම්බන්ධයෙන් ද විගණකාධිපතිවරයා මෙහිදී කරුණු දැක්වීය. මෙම මහාචාර්යවරියට හිමි රු. මිලියන 3.2 ක සේවක අර්ථසාධක අරමුදලක් ද ඇයට හිමි රු. මිලියන 3.7 ක හිඟ වැටුප් හා දීමනා සහ සේවක පාරිතෝෂික අරමුදල් ද වශයෙන් අදාළ නීති රෙගුලාසිවලට පටහැනිව ගෙවා ඇති බව හෙළිවිය. 2020 වසරේ සිදුවූ මෙම සිදුවීම ව්‍යාජ ලේඛන සකසා සිදුකළ වංචාවක් බැවින් මේ සම්බන්ධව ක්‍රියාත්මක නොවූයේ මන්දැයි විගණකාධිපතිවරයා කරුණු විමසන ලදී.පේරාදෙණිය විශ්ව විද්‍යාලයටත් අපකීර්තියක් ගෙනෙදෙන මෙවැනි සිදුවීම් නැවැත්වීමට පරිපාලනය වහාම මැදිහත්විය යුතු බව කමිටුව විසින් පෙන්වා දෙන ලදී.

**තවත් පරිපාලන දුර්වලතා සහ අක්‍රමිකතා රැසක්**

රු. මිලියන 7.5 ක වියදමින් ඉදිකරන ලද කලාගාරය වසර 6කට වැඩි කාලයක් නිෂ්කාර්යව පැවතීම, රු.මිලියන 8.3 ක වියදමින් ආරම්භකරන ලද පරිගණක පද්ධතියේ වැඩ වසර 6ක් ගතවුවද අවසන්කර නොතිබීම ඇතුළු කරුණු ගණනාවක් පිළිබඳවද මෙහිදී අවධානය යොමුවිය.






# ජාතික හා ජාත්‍යන්තර රැකියා වෙළඳපොළ ඉලක්ක කරගනිමින් සියලු වෘත්තීය පුහුණු ආයතන හා සම්පත් ඒකරාශී කොට පොදු වැඩපිළිවෙලක් සකස් කිරීම කඩිනම් කරන්න - කෝප් අනුකමිටුව

ජාතික හා ජාත්‍යන්තර රැකියා වෙළඳපොළ ඉලක්ක කරගනිමින් සියලු වෘත්තීය පුහුණු ආයතන හා සම්පත් ඒකරාශී කොට පොදු වැඩපිළිවෙලක් සකස් කිරීම කඩිනම් කරන ලෙස පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ තෘතීක කාර්මික අධ්‍යාපන ආයතනවලට අදාළ අනුකමිටුව විසින් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්වරයාට උපදෙස් ලබා දෙන ලදී.

ඉහළ වැටුප් සහිත ඇතැම් විදේශීය රැකියා සඳහා විශාල ඉල්ලුමක් පවතින බැවින් ගුණාත්මක බවින් යුතු පුහුණු ශ්‍රමිකයන් බිහිකිරීම සඳහා සියලු ආයතන ඒකාබද්ධව ක්‍රියාත්මක වීමේ අවශ්‍යතාව අනුකමිටුව අවධාරණය කරන ලදී.



2023 මැයි මස 16 වැනිදා පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී තෘතීක හා වෘත්තීය පුහුණු කොමිෂන් සභාව ඇතුළු වෘත්තීය පුහුණු ආයතනවලට ලබා දුන් නිර්දේශ ක්‍රියාත්මක වීමේ ප්‍රගතිය සාකච්ඡා කිරීම සඳහා පත්කරන ලද අනුකමිටුවේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මධුර විතානගේ මහතාගේ ප්‍රධානත්වයෙන් මේ මස 03 වැනිදා එම අනුකමිටුව රැස්වූ අවස්ථාවේදී මෙම උපදෙස් ලබාදීම සිදුවිය.

අධ්‍යාපන අමාත්‍යාංශය, තෘතීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව, ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, වෘත්තීය පුහුණු අධිකාරිය, ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය ඇතුළු ආයතන නියෝජනය කරමින් නිලධාරීහු මෙම රැස්වීමට කැඳවා තිබිණි.

ඇතැම් වෘත්තීය පුහුණු ආයතනවල කාර්ය සහ අරමුණු ඒකාකාරී වීම ගැටලුවක් බැවින් යම් පොදු වැඩපිළිවෙලක අවශ්‍යතාව මෙහිදී සාකච්ඡා විය. සා පෙළ සහ උසස් පෙළ විභාග අවසන් කළ සිසුන් සම්බන්ධ කරගනිමින් මේ සම්බන්ධයෙන් නව වැඩපිළිවෙලක් ආරම්භ කර ඇති බවත් මෙහි නියමු ව්‍යාපෘතියක් සැප්තැම්බර් ක්‍රියාත්මක බවත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්වරයා මෙහිදී පැවසීය් එසේම මෙවැනි ව්‍යාපෘති විවිධ රජයේ යටතේ වෙනස් නොවන ලෙස පොදු ප්‍රතිපත්තියක් සැකසීමේ අවශ්‍යතාව කමිටුව විසින් අවධාරණය කරන ලදී.



වෘත්තීය පුහුණු ආයතනවල ඉගැන්වීම් සිදු කරන උපදේශකවරුන්ගේ වැටුප්තල පහළ තත්ත්වයක තිබීම ඇතුළු ගැටලු පිළිබඳව මෙහිදී අවධානය යොමු විය. මේ අනුව සිසුන්ගෙන් අයකර ගනු ලබන සාධාරණ ගාස්තු සහ උපදේශකවරුන්ගේ කාර්යසාධනය පදනම් කරගනිමින් මේ සම්බන්ධයෙන් නිසි වැඩපිළිවෙලක් සකස් කරන ලෙසත් මාසයක් තුළ වාර්තා කරන ලෙසත් අනුකමිටුව අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්වරයාට උපදෙස් දුන්නේය.

මෙම ආයතන සියල්ල සම්බන්ධ කරගනිමින් ජාතික තොරතුරු පද්ධතියක් සකස් කිරීම පිළිබඳව ද මෙහිදී සාකච්ඡා විය. තෘතීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව සතුව දැනටමත් දත්ත පද්ධතියක් පැවතියද දැනට ඊට සම්බන්ධ නොවන විභාග දෙපාර්තමේන්තුව ආදී ආයතන ඒකාබද්ධ කොට එය වැඩිදියුණු කරන ලෙසද මෙහිදී නිර්දේශ කරන ලදී.

එසේම ව්‍යාජ NVQ සහතික හඳුනාගෙන වැරදිකරුවන්ට දඬුවම් කිරීමේ අවශ්‍යතාවද කමිටුව පෙන්වා දුන්නේය. QR කේතයන් මගින් මෙම සහතික හඳුනාගත හැකිවුවද නෛතික ක්‍රියාමාර්ග ගැනීම සඳහා පවතින අඩුලුහුඩුකම් සම්පූර්ණ කිරීම සඳහා පනත සංශෝධන කිරීම කඩිනම් කරන ලෙස කාරක සභාව උපදෙස් ලබාදීම සිදුකරන ලදී.

රාජ්‍ය හා පෞද්ගලික යාන්ත්‍රණය තුළ රැකියා තනතුරු නාමය ජාත්‍යන්තර හා දේශීයව පිළිගත් නාමයන් බව පත් කිරීමේ අවශ්‍යතාව කාරක සභාව පෙන්වා දෙන ලදී. මේ සම්බන්ධව කලමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමග එක්ව කටයුතු කරන ලෙස ද උපදෙස් ලබා දීම සිදුවිය.

NVQ සහතික ලබා දෙන පාඨමාලා නිසිපරිදි නියාමනය කිරීමේ අවශ්‍යතාව මෙහිදී අවධාරණය කෙරිණි. මූල්‍ය ලාභය පමණක් සලකා ගුණාත්මක නොවන පාඨමාලා පවත්වන ලද ආයතන 81 ක් මේවන විට අතහිටුවා ඇති බවත් නිලධාරීහු මෙහිදී පැවසුහ. නමුත් ඉන් ඔබ්බට ගොස් පුවත්පත් දැන්වීම් මගින් ප්‍රසිද්ධ කිරීම හා එම ආයතන මුද්‍රා තැබීමට අදාළව නෛතික පියවර සහිත විධිමත් වැඩපිළිවෙලක් සකස් කරන ලෙස ද කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

## විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සතු බලතල පවරා ගැනීම රාජ්‍ය නොවන විශ්ව විද්‍යාලවලින් පිරිනමන උපාධි පාඨමාලාවල ගුණාත්මක බව පරීක්ෂා කිරීම ඇතුළු ගැටලු සඳහා මාස තුනක් තුළ විසඳුම් යෝජනා කරන්න - කෝප් කමිටුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්වරයාට නියෝග

- **උසස් පෙළ විද්‍යා ගණිත විෂයන් හැදෑරීමට සිසුන්ට වැඩි අවස්ථාවක් ලබාදීමට ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීමටත් උපදෙස්**
- **සෑම ශාස්ත්‍ර පීඨයකම තොරතුරු තාක්ෂණය පිළිබඳ අධ්‍යයනාංශයක් පිහිටුවීමට පියවර**




පාර්ලිමේන්තු මන්ත්‍රී මහාචාර්ය ගරු රංජිත් බණ්ඩාර මහතාගේ සභාපතීත්වයෙන් මේ මස 25 වැනිදා රැස්වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට (කෝප් කමිටුව) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව කැඳවා තිබිණි. මෙහිදී 2023 අප්‍රේල් 28 දින පැවති කෝප් කමිටු රැස්වීමේදී ලබා දුන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සමාලෝචනය කිරීම සිදුවිය.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් නිහාල් රණසිංහ, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සම්පත් අමරතුංග, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලේකම් ආචාර්ය ප්‍රියන්ත ප්‍රේමකුමාර යන මහත්වරු ඇතුළු පිරිසක් මෙම අවස්ථාවට කැඳවා තිබිණි.

**රැකියා වෙළඳපොළට ගැළපෙන පාඨමාලා හඳුන්වාදීම**

මීට පෙර ලබා දී ඇති කෝප් නිර්දේශයකයට අනුව රැකියා වෙළඳපොළට ගැළපෙන ලෙස විශ්ව විද්‍යාලවල පාඨමාලා ප්‍රතිසංවිධානය කිරීමේ අවශ්‍යතාව සාකච්ඡා විය.

සෑම ශාස්ත්‍ර පීඨයකම තොරතුරු තාක්ෂණය පිළිබඳ අධ්‍යයනාංශයක් පිහිටුවීමට පියවර ගෙන ඇති බවද ඒ සඳහා ගැසට් පත්‍රයක්ද නිකුත් කර අවසන් බවත් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයා මෙහිදී පැවසීය. ඒ සඳහා සුදුසුකම්ලත් ආචාර්යවරු පත් කිරීමට ද පියවර ගෙන ඇත. මේ අනුව රු මිලියන 400ක් වැය කර විශ්ව විද්‍යාල 15ක නව පරිගණක විද්‍යාගාර පිහිටවූ බව ද ඒ මහතා පැවසීය.

**කලා විෂය වෙනුවට උසස් පෙළ විද්‍යා ගණිත විෂයන් හැදෑරීමට සිසුන්ට වැඩි අවස්ථාවක් ලබාදීමට ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීමට උපදෙස්**

නවීන රැකියා වෙළඳපොල පිළිබඳ පරීක්ෂා කිරීමේදී කලා විෂය ධාරාව වෙනුවට විද්‍යා ගණිත අංශ සඳහා වැඩි අවස්ථාවක් සිසුන්ට ලබාදීමේ අවශ්‍යතාව කමිටුවේදී අවධාරණය කෙරිණි. සිසු දරුවන්ට උසස්පෙළට විද්‍යා විෂයන් හැදෑරීමට අවශ්‍යතාව තිබුණද පාසැල් මට්ටමින් ඒ සඳහා අවස්ථාව ලබා නොදීම බලවත් ගැටලුවක් බව මෙහිදී සාකච්ඡා විය.



එසේම ජාතික පාසැල් සහ පළාත් සභා පාසැල්වල ගුරුවරු ඇතුළු තොරතුරු පිළිබඳව නිවැරදි දත්ත නොමැති වීම ගැටලුවක් බැවින් නිවැරදි දත්ත පද්ධතියක් සකස් කරන ලෙස අධ්‍යාපන ලේකම්වරයාට උපදෙස් ලබා දීමසිදුවිය.

උසස්පෙළ විද්‍යා ගණිත විෂයන් හැදෑරීමට අවස්ථාව ලබාදීම සම්බන්ධව ප්‍රතිපත්තිමය තීරණයක් ගන්නා ලෙස කෝප් සභාපතිවරයා අධ්‍යාපන ලේකම්වරයාට උපදෙස් දුන්නේය. ඉදිරියේදී STEM අධ්‍යාපන වැඩසටහන ඔස්සේ පාසැල් කාණ්ඩ කොට මේ සම්බන්ධව පරිපාලනමය ප්‍රතිසංස්කරණ සිදුකරන බව ලේකම්වරයා පැවසීය. මෙහිදී පාසැල් කාණ්ඩගත කොට අවශ්‍ය සම්පත් බෙදාහදා ගැනීමට ද ජාතික පාසැල් සහ පළාත් සභා පාසැල් එකම කණ්ඩායමක් ලෙස පරිපාලන කටයුතු සිදු කිරීමට පියවර ගන්නා බවත් මහතා පැවසීය. ඒ අනුව තව සති දෙකක කාලයකින් මෙම කටයුතු ආරම්භ කිරීමට හැකිවන බවත් ලේකම්වරයා වැඩිදුරටත් පැවසීය.



**රාජ්‍ය නොවන විශ්ව විද්‍යාලවලින් පිරිනමන උපාධි පාඨමාලාවල ගුණාත්මක බව පරීක්ෂා කිරීම ඇතුළු ගැටලු සඳහා මාස තුනක් තුළ විසදුම් යෝජනා කරන ලෙසට නියෝග**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ රාජ්‍ය නොවන විශ්ව විද්‍යාල පාලනය පිළිබඳ බලය නැවත ගැසට් නිවේදනයක් මගින් අධ්‍යාපන අමාත්‍යාංශයට 2012 වසරේ පවරා ගෙන ඇති බැවින් මේ වන විට රාජ්‍ය නොවන විශ්ව විද්‍යාල නියාමනයක් සිදුනොවන බවට මෙහිදී ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයා පැවසීය. මේ අනුව රාජ්‍ය විශ්ව විද්‍යාල නියාමනයට ඇති බලතල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ලබාගතහොත් එය මෙරට රාජ්‍ය විශ්ව විද්‍යාල පද්ධතියේද බිඳවැටීම බව ද ඒ මහතා පැවසීය.

මේ අනුව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම සතු බලතල පවරා ගැනීම, රාජ්‍ය නොවන විශ්ව විද්‍යාලවලින් පිරිනමන උපාධි පාඨමාලාවල ගුණාත්මක බව පරීක්ෂා කිරීම සහ මෙම විශ්ව විද්‍යාවල ලියාපදිංචිය සම්බන්ධව ඇති ගැටලුකාරී තත්ත්වයට මාස තුනක් තුළ විසදුම් යෝජනා කරන ලෙස දැනුම් දුන්නේය.

මීට අමතරව දිස්ත්‍රික් කුසලතාව මත බඳවා ගැනීම වැඩි කිරීම, සප්ත වාර්ෂික නිවාඩු ලබා ගෙන අධ්‍යයන කටයුතු සඳහා විදේශ ගතවන අධ්‍යයන කාර්ය මණ්ඩල නැවත සේවයට වාර්තා නොකිරීම මත බැදුම්කර අයකර ගැනීම වැනි කරුණු කාරණා කෙරෙහිද අවධානය යොමු විය.





# නිවැරදි ආර්ථික ප්‍රතිපත්තියක් ඇත්නම් වසර 10 ක් ඇතුළත මෙරට දියුණු කළ හැකියි - විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති



නිවැරදි ආර්ථික ප්‍රතිපත්තියක් ඇත්නම් වසර 10 ක් ඇතුළත මෙරට දියුණු කළ හැකි බව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සම්පත් අමරතුංග මහතා පැවසීය.

ඒ මහතා මේ බව පැවසුවේ රජය විසින් ප්‍රකාශයට පත් කළ මූල්‍ය බංකොලොත්භාවයට හේතු පරීක්ෂා කර පාර්ලිමේන්තුවට වාර්තා කිරීමටත්, ඒ පිළිබඳව සිය යෝජනා හා නිර්දේශ ඉදිරිපත්කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු සාගර කාරියවසම් මහතාගේ ප්‍රධානත්වයෙන් මේ මස 02 වැනිදා පාර්ලිමේන්තුවේදී රැස් වූ අවස්ථාවේදීය.

මෙම කාරක සභාව සඳහා අදහස් ලබාගැනීමට විශ්ව විද්‍යාල නියෝජනය කරන ආර්ථික ක්ෂේත්‍රයේ ප්‍රවීණයින් කැඳවා තිබූ අතර ශ්‍රී ලංකාවේ සියලුම විශ්ව විද්‍යාල නියෝජනය කරන මහාචාර්යවරුන් සහ ආචාර්යවරුන් මේ සම්බන්ධයෙන් තම අදහස් කමිටුව වෙත ඉදිරිපත් කිරීම සිදු විය.

මෙහිදී වැඩිදුරටත් අදහස් දැක් වූ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සම්පත් අමරතුංග මහතා සඳහන් කළේ මෙරට නිෂ්පාදන ආර්ථිකය වැඩිකරගැනීම අවශ්‍ය වන බවත් ඒ වෙනුවෙන් ප්‍රතිපත්ති සකස් කිරීම වැදගත් වන බවත්ය. උදාහරණ ලෙස වියට්නාමයේ නිෂ්පාදන ආර්ථිකයට ප්‍රමුඛතාවක් ලබා දී තිබෙන බවත් මෙරට සේවා ආර්ථිකයක් පවතින බවත් ඒ මහතා සඳහන් කළේය. එසේම මෙරට දේශපාලන ස්ථාවරභාවයක් පැවතීම විදේශීය ආයෝජකයින් මෙරටට පැමිණීමේදී වැදගත් වන බවත් ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයා පෙන්වා දුන්නේය.

තවද 1960 දශකය ලෝක ආර්ථිකයේ සක්‍රියම කාලසීමාව ලෙස පැවති බවත් පරිගණකය හඳුන්වාදීම මගින් ලෝක වෙළඳාම පුළුල් වූ බවත් හෙතෙම පැහැදිලි කළේය.

එසේම කොවිඩ් කාලසීමාව තුළදී මෙරට අපනයන සම්පූර්ණයෙන්ම පාහේ නැවතුන බවද පෙන්වාදුන් ඒ මහතා මෙරට දුප්පත් ජනතාවට ආහාර ලබාදීම වෙනුවෙන් මුදල් සහන ලබාදීමට සහ රාජ්‍ය සේවකයන්ගේ වැටුප් ගෙවීමට මෙම කාලසීමාව තුළ මුදල් මුද්‍රණය කිරීමට සිදුවූ බවත් පෙන්වා දුන්නේය.

කෙසේ වෙතත් මේ වන විට 70% පමණ පැවති උද්ධමනය මහ බැංකුවේ මැදිහත්වීමෙන් 10% ක පමණ තත්ත්වයට පාලනය කිරීමට සමත් වී ඇති බවද මහාචාර්යවරයා සඳහන් කළේය. එසේම අද වන විට සේවා වියුක්තියේ පුරෝකථනයක් පවතින බවත් නිවැරදි ගණනය කිරීමක් නොපවතින බවත් ඒ මහතා පැවසීය.

තවද මෙහිදී අදහස් දක්වමින් කැලණිය විශ්ව විද්‍යාලයේ මහාචාර්ය අජිත් දිසානායක මහතා පෙන්වා දුන්නේ නිෂ්පාදකයන් ආරක්ෂාකිරීම සම්බන්ධයෙන් විධිමත් වැඩ පිළිවෙළක් මෙරට නොපවතින බවයි. එසේම ආර්ථිකය සම්බන්ධයෙන් ස්ථිර ජාතික ප්‍රතිපත්තියක අවශ්‍යතාවයද ඒ මහතා පෙන්වා දුන්නේය.

වයඹ විශ්ව විද්‍යාලයේ මහාචාර්ය අමින්ද පෙරේරා මහතා පෙන්වා දුන්නේ මෙරට ආර්ථික ප්‍රතිපත්තිය සහ දේශපාලන ප්‍රතිපත්තිය පටලවාගෙන ඇති බවයි. මේ නිසා ස්වාධීන ආර්ථික ප්‍රතිපත්තියක් මෙරටට අවශ්‍ය බව මහාචාර්යවරයා පෙන්වා දුන්නේය. මේ සඳහා හොඳම උදාහරණය ඉන්දියාව බවත් එරට ආර්ථික ප්‍රතිපත්තිය දේශපාලන ප්‍රතිපත්තිය සමග බද්ධවී නැති බවත් ඒ මහතා සඳහන් කළේය.

එසේම පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ මහාචාර්ය ප්‍රසන්න පෙරේරා මහතාද මෙහිදී අදහස් දක්වමින් කරුණු 5ක් පිළිබඳ පැහැදිලි කළ අතර එම අදහස් ලිඛිතව මෙම කමිටුව වෙත ලබාදීමටද කටයුතු කරන බව පැවසීය. කොළඹ විශ්ව විද්‍යාලයේ මහාචාර්ය නිහාල් හෙන්නායක මහතා පෙන්වා දුන්නේ තොරතුරු පසු විපරම් කිරීම සඳහා මෙරට ඒකකයක් නැති බවයි මේ නිසා ආර්ථික බුද්ධි තොරතුරු ඒකකයක් මෙරටට වැදගත් වන බව ඒ මහතා පෙන්වා දුන්නේය.

එසේම මහාචාර්ය බන්ධුල ජයතිලක මහතා පෙන්වා දුන්නේ විදේශ විශ්ව විද්‍යාලවල සහායද මෙම අංශ කෙරෙහි ලබාගත යුතු බවයි තවද මහාචාර්ය සිරිමල් අබේරත්න මහතා ණය තිරසාර කිරීම සහ මෙරටට ආයෝජන ලබාගැනීම පිළිබඳව පැහැදිලි කරන ලදි. විශේෂයෙන්ම මෙරටට ආයෝජකයන් පැමිණීමේදී ඒ වෙනුවෙන් අවශ්‍ය සහයෝගයන් සපයාදීමේ අවශ්‍යතාවයද ඒ මහතා පෙන්වා දුන්නේය.

කාරක සභා පුවත්

# ගොවීන්ගෙන් වී මිලදී ගැනීමේදී මතුව ඇති ගැටලු විසඳීමට කඩිනමින් පියවර ගන්නවා - කෘෂිකර්ම අමාත්‍ය ගරු මහින්ද අමරවීර මහතා

ගොවීන්ගෙන් වී මිලදී ගැනීමේදී මතුව ඇති ගැටලු විසඳීමට කඩිනමින් පියවර ගන්නා බව කෘෂිකර්ම අමාත්‍ය ගරු මහින්ද අමරවීර මහතා පැවසීය.



වී මිලදී ගැනීම සඳහා වී අලෙවි මණ්ඩලයට ප්‍රමාණවත් මුදල් වෙන්කර නැති බැවින් මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු මුදල්වලින් වී යම් ප්‍රමාණයක් මිලදී ගෙන ඇති බවද අමාත්‍යවරයා පැවසීය. මෙම තත්ත්වය තුළ ගොවීන්ට අපේක්ෂිත මිල නොලැබීම හේතුවෙන් වී අලෙවි කිරීමට උනන්දු නොවන බවද අමාත්‍යවරයා සඳහන් කළේය.

අමාත්‍යවරයා මේ බව පැවසුවේ මේ මස 09 වැනිදා පාර්ලිමේන්තුවේ පැවති කෘෂිකර්ම කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා රැස්වීමේදී වී මිලදී ගැනීම සම්බන්ධයෙන් මන්ත්‍රීවරුන් නැගූ ගැටලු වලට පිළිතුරු ලබාදෙමිනි.



වී මිලදී ගැනීම සඳහා නියම කර ඇති අවම මිලට වී මිලදී ගත්තද එම මිලට වඩා අඩු මිලකට සහල් අලෙවි කිරීමට වී අලෙවි මණ්ඩලයට සිදුවන බව අමාත්‍යවරයා පෙන්වා දුන්නේය. මෙම තත්ත්වය තුළ වී මිලදී ගැනීම සම්බන්ධයෙන් පවතින ගැටලු අදාළ පාර්ශ්ව සමග සාකච්ඡා කර විසඳා ගැනීමට පියවර ගන්නා බවද ඔහු දැනුම් දුන්නේය. මඩකලපුව සහ අම්පාර දිස්ත්‍රික්කවල ගොවීන් අනෙකුත් ප්‍රදේශවලට පෙර කන්නය ආරම්භ කරන බැවින් වැඩි මිලට පොහොර මිලදී ගැනීමට සිදුව ඇති බව එම ප්‍රදේශවල මන්ත්‍රීවරු පෙන්වා දුන්හ. කන්නය තීරණය කිරීම සඳහා පැවැත්වෙන කන්න රැස්වීමේදී කන්නය ආරම්භ කරන දිනය පොදුවේ තීරණය කිරීම කෙරෙහි අවධානය යොමු කරන බව අමාත්‍යවරයා මෙහිදී පැවසීය. මේ අනුව සමස්ත දිවයිනම බලපාන පරිදි කන්නය ආරම්භ වන දිනය පිළිබඳව ප්‍රසිද්ධ නිවේදනයක් නිකුත් කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇති බවද අමාත්‍යවරයා සඳහන් කළේය.

එමෙන්ම බිත්තර නිෂ්පාදනය අඩුවීම හේතුවෙන් බිත්තර මිල ඉහළ මට්ටමක පවතින බවත් නිෂ්පාදනය ක්‍රමයෙන් ඉහළ යාම හේතුවෙන් ඉදිරියේදී බිත්තර මිල අඩුවිය හැකි බවත් අමාත්‍යවරයා පෙන්වා දුන්නේය.






# වසර 50කට අධික කාලයක් හිමිකරුවන්ට ඉඩම් ඔප්පු ලබාදීමට කටයුතු නොකිරීම සම්බන්ධයෙන් සංචාරක හා ඉඩම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ අවධානය



හිමිකරුවන්ට ඉඩම් ඔප්පු ලබාදීම වසර 50කට අධික කාලයක් ප්‍රමාද කිරීම සම්බන්ධයෙන් සංචාරක හා ඉඩම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ නිලධාරීන්ගෙන් විමසන ලදි.

මේ පිළිබඳ සාකච්ඡා කෙරුණේ සංචාරක හා ඉඩම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව අමාත්‍ය ගරු හරීන් ප්‍රනාන්දු මහතාගේ සභාපතිත්වයෙන් මේ මස 09 වැනිදා පාර්ලිමේන්තුවේදී රැස් වූ අවස්ථාවේදීය.

මෙහිදී ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව නියෝජනය කරමින් පැමිණ සිටි නිලධාරීන් ප්‍රකාශ කළේ මෙම ඉඩම් විවිධ පාර්ශ්වයන්ට පවරා දී ඇති බවත් දැනට එම පැවරුම්කරුවන්ගේ දරු මුනුබුරන් විසින් විසින් එම ඉඩම් භාවිත කරන බවත්ය. මේ නිසා ලේඛන ඉදිරිපත් කිරීමේදී ගැටලුවක් මතුව ඇති බව එම නිලධාරීන් පකාශ කළ අතර මේ වනවිට එම කටයුතු විධිමත් කරමින් පවතින බවත් ඔවුහු පෙන්වා දුන්හ.

කමිටුවේ සභාපති  අමාත්‍ය ගරු හරීන් ප්‍රනාන්දු මහතා පෙන්වා දුන්නේ පවත්නා ක්‍රියාමාර්ගයන්ට වඩා ඉක්මන් ක්‍රියාමාර්ග ගැනීම වැදගත් වන බවයි. ඒ අනුව, ගැටලුව විසඳීම සඳහා නියමු ව්‍යාපෘතියක් ලෙස මහනුවර දිස්ත්‍රික්කයෙන් ආරම්භ කර ක්‍රමානුකූලව වෙනත් දිස්ත්‍රික්කවලට ගොස් ඔප්පු නිවැරදිව ලබාදීමේ වැඩසටහනක් ආරම්භ කරන ලෙස අමාත්‍යවරයා නිලධාරීන්ට උපදෙස් ලබාදුන්නේය. එසේම ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මෙවැනි කරුණු සම්බන්ධයෙන් ඉක්මනින් සොයා බැලා කටයුතු කළ යුතු බවද හෙතෙම සඳහන් කළේය.

තවද, බලංගොඩ දමන ප්‍රදේශයේ පාරම්පරිකව කළු ගල් කැණීමේ කර්මාන්තයේ නියැළෙන 7000ක පමණ පිරිසකට කළු ගල් කැඩීම සඳහා වාර්ෂිකව නව බලපත්‍රයක් ලබාදීම සම්බන්ධයෙන් කරන ලද ඉල්ලීම පිළිබඳවද කමිටුවේ සාකච්ඡාවට ලක් විය.



තවද, නව සංචාරක ස්ථාන හඳුනා ගැනීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා සෑම සංචාරක ප්‍රදේශයකම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලද සියලුම කමිටුවල ප්‍රගතිය පිළිබඳව ද මෙහිදී සාකච්ඡා වියි එසේම දෙණියාය පාරිසරික සංචාරක කලාප සංවර්ධනයේ ප්‍රගතිය පිළිබඳව ද මෙහිදී සාකච්ඡා විය.



කාරක සභා පුවත්

# ආහාර සුරක්ෂිතතාවය (කෘෂිකර්ම, සත්ත්ව පාලනය සහ ධීවර කටයුතු) පිළිබඳ සංකල්පීය ප්‍රතිපත්ති රාමුව පිළිබඳ වාර්තාවේ කෙටුම්පත ජාතික සභාවට

ආහාර සුරක්ෂිතතාවය (කෘෂිකර්ම, සත්ත්ව පාලනය සහ ධීවර කටයුතු) පිළිබඳ සංකල්පීය ප්‍රතිපත්ති රාමුව පිළිබඳ වාර්තාවේ කෙටුම්පත ජාතික සභාවේ අනුමතිය සඳහා ඉදිරිපත් කරන ලදි.

මෙම කෙටුම්පත ජාතික සභාවට ඉදිරිපත් කෙරුණේ ජාතික සභාව කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන සහ අග්‍රාමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන යන මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් මේ මස 22 වැනිදා පාර්ලිමේන්තුවේදී රැස්වූ අවස්ථාවේදී ය.

කෙටි, මධ්‍යම හා දිගුකාලීන ජාතික ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේදී ප්‍රමුඛතා හඳුනා ගැනීම පිළිබඳ ජාතික සභාවේ අනු කාරක සභාවේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නාමල් රාජපක්ෂ මහතා විසින් ආහාර සුරක්ෂිතතාවය (කෘෂිකර්ම, සත්ත්ව පාලනය සහ ධීවර කටයුතු) පිළිබඳ සංකල්පීය ප්‍රතිපත්ති රාමුවක් සකස්කිරීම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අසංක නවරත්න මහතාගේ සභාපතිත්වයෙන් ක්‍රියාකාරී කමිටුවක් පත් කර තිබූ අතර එම ක්‍රියාකාරී කමිටුව විසින් මෙම වාර්තාව ජාතික සභාවේ අනුමතිය සඳහා ඉදිරිපත් කරන ලදි.

මෙහිදී අදහස් දක්වමින් අග්‍රාමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන මහතා සඳහන් කළේ ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනු කමිටුවක්ද පවතින බවයි. මේ නිසා එම අනු කමිටුව හා සාකච්ඡා කර එහි අදහස් මේ සඳහා ලබාගැනීම සුදුසු බව ගරු අග්‍රාමාත්‍යවරයා ප්‍රකාශ කළේය. ඒ අනුව එම අමාත්‍ය මණ්ඩල අනුකමිටුවෙන්ද අවශ්‍ය අදහස් ලබාගැනීමට කටයුතු කරන බව පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නාමල් රාජපක්ෂ මහතා සඳහන් කළේය.





මෙම සංකල්පීය ප්‍රතිපත්ති රාමුව පිළිබඳ වාර්තාවේ කෙටුම්පත ජාතික සභාවට ඉදිරිපත් කරමින් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අසංක නවරත්න මහතා සඳහන් කළේ විශාල කැපකිරීමක් සිදු කොට ඒ ඒ පාර්ශ්වවල අදහස් ලබාගනිමින් මෙම කෙටුම්පත සකස් කොට ඇති බවයි එසේම පැරණි නීති සංශෝධනය විය යුතු ආකාරය පිළිබඳව ද මෙම කෙටුම්පත මගින් යෝජනා කොට ඇති බවද හෙතෙම පැවැසීය.

තවද මෙහිදී අදහස් දක්වමින් කෙටි, මධ්‍යම හා දිගුකාලීන ජාතික ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේදී ප්‍රමුඛතා හඳුනා ගැනීම පිළිබඳ ජාතික සභාවේ අනු කාරක සභාවේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නාමල් රාජපක්ෂ මහතා සඳහන් කළේ ජාතික සභාව මගින් ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීම පිළිබඳ වැඩි වශයෙන් අවධානය යොමු කළ යුතු බවයි.



කාරක සභා පුවත්

# සීනි බදු වංචාවෙන් මෙරටට සිදුවූ පාඩුව අයකර ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ගය සම්බන්ධයෙන් රාජ්‍ය මුදල් පිළිබඳ කමිටුව මුදල් අමාත්‍යාංශයෙන් ප්‍රශ්න කරයි



පසුගිය සමයේ සිදුවූ සීනි බදු වංචාවෙන් මෙරටට සිදු වූ පාඩුව අයකර ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ගය සම්බන්ධයෙන් රජයේ මුදල් පිළිබඳ කාරක සභාව මුදල් අමාත්‍යාංශය නියෝජනය කරන නිලධාරීන්ගෙන් ප්‍රශ්න කළේය. මේ සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශය මෙතෙක් නිසි ක්‍රියාමාර්ගයක් ගැනීමට අපොහොසත් වීම පිළිබඳව කමිටුව සිය අප්‍රසාදය පළ කළේය.

මෙම කරුණ මතු වුයේ මේ මස 08 වැනිදා පාර්ලිමේන්තුවේ දී පැවැති රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදීයි එහි සභාපති ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා වෙනුවට තාවකාලිකව පත්වූ සභාපතිවරයා වන ගරු පාඨලී චම්පික රණවක මහතාගේ ප්‍රධානත්වයෙන් එදින කාරක සභාව රැස්විය.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව නීතිපතිවරයා සමඟ සාකච්ඡා කර මේ සම්බන්ධයෙන් මෙතෙක් පියවරක් නොගන්නේ මන්දැයි කමිටුව මෙහිදී අමාත්‍යාංශ නිලධාරීන්ගෙන් ප්‍රශ්න කළේය.

ඒ අනුව මුදල් අමාත්‍යාංශය වෙනුවෙන් පෙනී සිටි නිලධාරීන් ප්‍රකාශ කළේ එහි ප්‍රගතිය පිළිබඳව තමන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව යාවත්කාලීන කරමින් සිටින බවත්, නීතිපති දෙපාර්තමේන්තුව උපදෙස් දී ඇත්තේ මේ සම්බන්ධයෙන් නඩුවක් විභාග වෙමින් පවතින බැවින් අදාළ තීරණයෙන් පසුව ඉදිරි කටයුතු සිදුකරන බවයි.

අනතුරුව කාරක සභාව විමසා සිටියේ අදාළ පාර්ශ්ව අධිකරණයේ විභාග වෙමින් පවතින නඩුව ඉල්ලා අස්කර ගන්නේ නම් පියවරක් ගත හැකිද යන්නයි ඒ අනුව හැකි ඉක්මනින් මේ සම්බන්ධයෙන් කමිටුව දැනුවත් කරන ලෙස කාරක සභාව නීතිපති දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා සිටියේය.



තිරිඟු පිටි සම්බන්ධයෙන් ආනයන අපනයන පාලන පනත යටතේ ඇති රෙගුලාසි යටතේ නිකුත් කර ඇති ගැසට් පත්‍රයේ මීට පෙර පළ වූ රෙගුලාසිවලට අදාළව ඉදිරිපත් කර ඇති ගැටළු සම්බන්ධයෙන්ද මුදල් අමාත්‍යාංශය විසින් කමිටුව දැනුවත් නොකිරීම සම්බන්ධයෙන් ද කමිටුව අවධානය යොමු කළේය.

තවද, 2023.07.21 දිනැති රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදී අවධානයට ලක් කරන ලද 2023.07.18 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද අංක 2336/45 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද 1969 අංක 1 දරන ආනයන හා අපනයන පාලන පනත යටතේ ඇති රෙගුලාසි පිළිබඳවද මෙහිදී සාකච්ඡා කෙරිණි.

මෙහිදී තාවකාලික සභාපති ගරු පාඨලී චම්පික රණවක මහතා ප්‍රකාශ කළේ තිරිඟු පිටි ආනයනය සඳහා බලපත්‍රය නිකුත් කිරීම තිරිඟු පිටි ඇණවුම් කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කොට ඇති සමාගම්වලට පමණක් සීමා කිරීම හේතුවෙන් වර්තමානයේදී තිරිඟු පිටි සම්බන්ධ ද්වීඅධිකාරයක් නිර්මාණය වී ඇති බවයි ඒ සම්බන්ධයෙන් ගන්නා ලද ක්‍රියාමාර්ග සහ ප්‍රගතිය පිළිබඳවද කමිටුව මෙහිදී විමසා සිටියේය.

ඒ අනුව, 2022 අංක 43 දරන විසර්ජන පනතේ රුපියල් බිලියන 4.979 වූ ණය ගැනීමේ සීමාව රු.බිලියන 13.979 දක්වා වැඩි කිරීම මගින් රු.බිලියන 9,000 ක නැවත ණය නිකුත් කිරීම සඳහා ණය සීමාව සංශෝධනය කිරීමේ අවශ්‍යතාව සහ ණය ආපසු ගෙවීම සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට අවශ්‍ය ප්‍රතිපාදන සලසා දීමක් ලෙස රු. බිලියන 4,22223 සිට රු.බිලියන 13,222.23 ක් වූ වියදම් සීමාව වැඩි කිරීම සිදුවේ.

කාරක සභා පුවත්

# ප්‍රධාන සමාගම් ද්විත්වයට අතිරේක ලාභයක් ලැබිය නොහැකි වන පරිදි පාන්පිටි කිලෝවක විකුණුම් මිල රු.198ක් බව නිවේදනය කරන්න - මුදල් අමාත්‍යාංශයේ නිලධාරීන්ට රජයේ මුදල් පිළිබඳ කාරක සභාවෙන් උපදෙස්

■සිමෙන්ති කොට්ටයක ගොඩබාන මිල සහ විකුණුම් මිල අතර පරතරය රු.700කට ආසන්න බැවින් අයථා ලාභය පිළිබඳ වාර්තාවක් කැඳවයි

■රජයේ ආදායම වැඩිකරගැනීම සඳහා මුදල් අමාත්‍යාංශය මගින් සිදුකරන බදු වැඩිකිරීම් මගින් සිදුවන සමාජ බලපෑම පිළිබඳ නිසි ඇගයීමක් සිදු නොකිරීම විශාල ගැටලුවක්

මුදල් අමාත්‍යාංශයේ ගණනය කිරීම් අනුව පාන්පිටි කිලෝවක මිල රු.198ක් වන බැවින් පාන්පිටි සම්බන්ධ මෙරට ප්‍රධාන සමාගම් ද්විත්වයට අතිරේක ලාභයක් ලැබිය නොහැකිවන පරිදි පාරිභෝගිකයා ආරක්ෂා කිරීමට මේ බව නිවේදනයක් මගින් දැනුම්දෙන ලෙස මුදල් අමාත්‍යාංශ නිලධාරීන්ට රජයේ මුදල් පිළිබඳ කාරක සභාවෙන් නියෝග කෙරිණි.



රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා වෙනුවට තාවකාලිකව පත්වූ සභාපතිවරයා වන ගරු පාඨලී චම්පික රණවක මහතාගේ ප්‍රධානත්වයෙන් මේ මස 15 වැනිදා කාරක සභාව රැස්වූ අවස්ථාවේදී මේ පිළිබඳව සාකච්ඡා කෙරිණි.

පාර්ලිමේන්තුවේ අනුමතිය ලබාගැනීමට නියමිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ 2023.06.14 ප්‍රකාශයට පත්කරන ලද අංක 2336/45 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ඇති රෙගුලාසි පිළිබඳව මෙහිදී අවධානය යොමුවිය.




2023.06.14 ප්‍රකාශයට පත්කරන ලද ගැසට්පත්‍රය, මෙරටට පාන්පිටි ආනයනය කරන සමාගම් තොග වැඩිපුර රඳවා අතිරේක ලාභයක් ලැබීම වැළැක්වීම අරමුණු කරගනිමින් නිකුත් කළ බව මුදල් අමාත්‍යාංශයේ නිලධාරීන් පැවසූ බව කමිටු සභාපතිවරයා පැවසීය. එහෙත් මෙම තත්ත්වය තුළින් මෙරට පාන්පිටි සම්බන්ධයෙන් සියයට අසූවක වෙළඳපොළ අධිකාරීත්වය හිමි ප්‍රධාන සමාගම් ද්විත්වයට තිරිඟු ධාන්‍ය ලෙස ගෙන්වීමට අවස්ථාව හිමිවූ බැවින් අතිරේක ලාභයක් ඉපයීමට හැකියාව ලැබී ඇත්දැයි සොයා බැලිය යුතු බව කමිටුව විසින් පෙන්වා දෙන ලදී. මේ අනුව 2023.06.14 දින ප්‍රකාශයට පත්කරන ලද ගැසට්පත්‍රය මගින් අපේක්ෂිත අරමුණු කෙතරම් දුරට ඉෂ්ට වී ඇති ද යන්න තහවුරු කිරීම සඳහා පැවති පාන්පිටි තොග සහ වත්මන් තොග පිළිබඳ නිවැරදි දත්ත ලබා දෙන ලෙස මෙහිදී උපදෙස් දෙන ලදී. මේ අනුව මෙහිදී යම් අක්‍රමිකතාවක් සිදුව ඇත්දැයි සොයා බැලීම සඳහා අවකාශය ලැබෙනු ඇති බවද කමිටු සභාපතිවරයා පෙන්වා දුන්නේය.

1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ අංක 2336/71 දරන ගැසට් පත්‍රයේ පළ කර ඇති නියෝග පිළිබඳවද මෙහිදී අවධානය යොමු විය. සිමෙන්ති අමුද්‍රව්‍ය ආනයනයේදී අය කරන සෙස් බද්ද සිමෙන්ති අමුද්‍රව්‍ය කිලෝග්‍රෑම් එකකට රු.2කින් වැඩිකිරීමට අදාළ මෙම නියෝග පිළිබඳව මෙහිදී සාකච්ඡා විය. කමිටු සභාපතිවරයා පෙන්වා දුන්නේ සිමෙන්ති අමුද්‍රව්‍යවල සෙස් බද්ද වැඩිකිරීම හරහා ඉදිකිරීම් ක්ෂේත්‍රයට විශාල බලපෑමක් එල්ලවිය හැකි බවයි. තවද වරායට ගොඩබාන සිමෙන්ති මිල සහ විකුණුම් මිල අතර සියලු බදු අඩුකළ විට රු.700කට ආසන්න ලාභයක් ඇති බව කමිටුව පෙන්වා දුන්නේය.

සිමෙන්ති හා යකඩ ගොඩබාන මිල සහ අදාළ සියලු බදු අඩු කළ විට විකුණුම් මිල අතර විශාල පරතරයක් තබා ගනිමින් අයථා ලාභයක් ලබන බව පෙනීයන බැවින් ඒ පිළිබඳව වාර්තාවක් ලබා දෙන ලෙස මුදල් අමාත්‍යාංශයේ සහ නාගරික සංවර්ධන හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ නිලධාරීන්ට කමිටු සභාපතිවරයා නියෝග කළේය.



තවද නාගරික සංවර්ධන අධිකාරිය විසින් ආරම්භ කරන ලද නිවාස ව්‍යාපෘතිවලින් අඩු ආදායම්ලාභී නිවාස, මධ්‍යම පාන්තික නිවාස ඇතුළු නිවාස ගණනාවක වැඩ නැවතී ඇති බව හෙළි වූ අතර ඒ පිළිබඳව මෙන්ම ඉදිකිරීම් ක්ෂේත්‍රයට සිදුව ඇති බලපෑම පිළිබඳ වාර්තාවක් ලබාදෙන ලෙස දැනුම් දුන්නේය.

මීට පෙර ලක්ෂ 12ක පමණ වියදමකින් ඉදිකළ නිවසක් ඉදිකිරීම සඳහා අවම වශයෙන් රු ලක්ෂ 24ක් පමණ වියදමක් යන බව ද නිලධාරීහු පෙන්වා දුන්හ. රජයේ ආදායම වැඩිකරගැනීම සඳහා මුදල් අමාත්‍යාංශය මගින් සිදුකරන වැඩිකිරීම් මගින් සිදුවන සමාජ බලපෑම පිළිබඳ නිසි ඇගයීමක් සිදු නොකිරීම විශාල ගැටලුවක් බවද කමිටුව විසින් අවධාරණය කරන ලදීඑසේම සිමෙන්ති මිල නියාමනය සඳහා අදාළ අංශ මැදිහත්විය යුතු බව කමිටුව විසින් පෙන්වා දෙන ලදී.



2021 අංක 11 දරන වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ අංක 2343/60 දරන ගැසට් පත්‍රයේ පළ කළ නියෝග සහ 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන පනත යටතේ 2339/08 දරන ගැසට් පත්‍රයේ පළ කළ නියෝග සලකා බැලීම සිදුවියි ආයෝජන ගෙන්වා ගැනීම සඳහා සහනදායි පියවර අනගමනය කිරීම ඇතුළු කරුණු පිළිබඳව වරාය නගරය ආර්ථික කොමිෂන් සභාවේ සහ ආයෝජන මණ්ඩලයේ නිලධාරීහු කරුණු පැහැදිළි කළහ.

මේ අනුව උක්ත දක්වා ඇති නිර්දේශවලට යටත්ව මෙම ගැසට් පත්‍ර හතර සඳහා රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ අනුමතිය හිමිවිය.



කාරක සභා පුවත්

# මෙරට මත්ද්‍රව්‍ය උවදුර පාලනය කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ අවධානය



මෙරට මත්ද්‍රව්‍ය උවදුර පාලනය කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව රට තුළ සීඝ්‍ර ලෙස පැතිරෙමින් පවතින මත්ද්‍රව්‍ය උවදුර වහා පාලනය කොට මුලිනුපුටා දැමීම සඳහා ක්‍රියාත්මක කළ යුතු ක්‍රමවේද පිළිබඳ කරුණු සොයා බලා ඒ පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේදී සාකච්ඡා විය.

මේ පිළිබඳ සාකච්ඡා කෙරුණේ එම කාරක සභාව අමාත්‍ය ගරු ටිරාන් අලස් මහතාගේ සභාපතිත්වයෙන් මේ මස 10 වැනිදා පාර්ලිමේන්තුවේදී රැස් වූ අවස්ථාවේදීය.

මෙහිදී මෙම කාරක සභාව සඳහා ශ්‍රී ලංකා පොලීසිය, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය සහ දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය කැඳවා තිබූ අතර මෙරට මත්ද්‍රව්‍ය උවදුර පාලනය කිරීම සඳහා මෙම අංශ ගෙන ඇති පියවර පිළිබඳ සාකච්ඡා කිරීම සිදු විය.

මෙහිදී මෙම කමිටුවේ සභාපති අමාත්‍ය ගරු ටිරාන් අලස් මහතා සඳහන් කළේ මෙරට මත්ද්‍රව්‍ය උවදුර පාලනය කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්ධු තෙන්නකෝන් මහතාගේ ප්‍රධානත්වයෙන් විශේෂ කමිටුවක් පත්කොට ඇති බවයි.

එසේම මෙහිදී අදහස් දක්වමින් ශ්‍රී ලංකා පොලීසිය නියෝජනය කරමින් පැමිණි නිලධාරීන් සඳහන් කළේ මහා පරිමාණයෙන් මත්ද්‍රව්‍ය මෙරටට ගෙන ඒම නැවැත්වීමට විශාල වශයෙන් පියවර ගෙන ඇති බවයි ඒ වෙනුවෙන් අසල්වැසි රටවල බුද්ධි අංශ වලද සහය ලබාගන්නා බව ඔවුහු පැවසූහ.

තවද දුම්කොළ සහ මධ්‍යසාර භාවිතය අවම කිරීම සඳහා ගත හැකි යෝජනා කිහිපයක් දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය නියෝජනය කරමින් පැමිණි නිලධාරීන් විසින් කමිටුවට ඉදිරිපත් කරන ලදි. එසේම මත්ද්‍රව්‍ය භාවිතයට හුරුවූ පුද්ගලයින්ට ප්‍රතිකාර කිරීම වෙනුවෙන් අවශ්‍ය පියවර ගැනීම සඳහා අන්තරායකාර ඖෂධ පාලක ජාතික මණ්ඩලය කටයුතු කරන බව එය නියෝජනය කරමින් පැමිණි නිලධාරීහු මෙහිදී පැවසූහ. පැමිණ සිටි ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ද මත්ද්‍රව්‍ය පාලනය සම්බන්ධයෙන් යෝජනා සහ අදහස් ඉදිරිපත් කළ අතර මෙහිදී මෙම කාරක සභාවේ සභාපති අමාත්‍ය ගරු ටිරාන් අලස් මහතා සඳහන් කළේ මන්ත්‍රීවරුන්ගේ යෝජනාද සැලකිල්ලට ගෙන මෙම පැමිණ සිටි අංශ වල යෝජනා ඇතුළත් වාර්තාවක් කමිටුවට ලබාදීමට කටයුතු කරන ලෙසයි.



# ශ්‍රී ලංකා - එක්සත් රාජධානි පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමයේ සභාපතිවරයා ලෙස චන්දිම වීරක්කොඩි මහතා පත් කෙරේ




ශ්‍රී ලංකා - එක්සත් රාජධානි පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමයේ සභාපතිවරයා ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු චන්දිම වීරක්කොඩි මහතා මේ මස 08 වැනිදා පත් කෙරිණි.

ශ්‍රී ලංකා - එක්සත් රාජධානි පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමයේ නවවැනි පාර්ලිමේන්තුවට අදාළ නිලධාරි මඩුල්ල තෝරා පත්කර ගැනීමේ රැස්වීම කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් පාර්ලිමේන්තුවේදී පැවැත්විණි. මෙම රැස්වීමට ශ්‍රී ලංකා-වේ එක්සත් රාජධානියේ වැඩබලන මහ කොමසාරිස් ලීසා වැන්ස්ටෝල් මහත්මිය ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වූ අතර, නියෝජ්‍ය කථානායක ගරු අජිත් රාජපක්ෂ, පාර්ලිමේන්තු මැති ඇමතිවරුන් පිරිසක් සහ පාර්ලිමේන්තුවේ මහලේකම් කුෂානි රෝහණදීර මහත්මිය ඇතුළු පිරිසක් එක්ව සිටියහ.

මෙහිදී රාජ්‍ය අමාත්‍ය ගරු ඩයනා ගමගේ, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන ගරු එස්.එම්.එම්. මුෂාරෆ් සහ ගරු අශෝක් අබේසිංහ යන මහත්ම මහත්මීන් මිත්‍රත්ව සංගමයේ උප සභාපතිවරුන් ලෙස පත් විය. ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා ලේකම්වරයා ලෙසත්, ගරු හර්ෂණ රාජකරුණා සහකාර ලේකම්වරයා ලෙසත් පත් කරන ලද අතර, භාණ්ඩාගාරික ලෙස ගරු සාගර කාරියවසම් මහතා පත් කෙරිණි.

මෙම අවස්ථාවේ අදහස් දක්වමින් කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා සඳහන් කළේ, ශ්‍රී ලංකාව සහ එක්සත් රාජධානිය අතර දශක හතක කාලයක සිට පවතින ද්විපාර්ශ්වික සබඳතා තුළින් මෙරටට ලබා දුන් සියලු සහයෝගයන් සඳහා ස්තුතිය පළ කරන බවයි. එසේම ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වන වෙස්ට්මිනිස්ටර් පදනම (WFD) හරහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය සඳහා සම්මන්ත්‍රණ, වැඩමුළු සහ අධ්‍යයනචාරිකා මගින් අවස්ථාවන් ලබාදීම සම්බන්ධව කෘතවේදී වන බවද සඳහන් කළේය.

මෙහිදී අදහස් දැක්වූ ශ්‍රී ලංකාවේ එක්සත් රාජධානියේ වැඩබලන මහ කොමසාරිස් ලීසා වොන්ස්ටෝල් මහත්මිය ප්‍රකාශ කළේ, ආර්ථික අර්බුදයෙන් මිදීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව සහ එක්සත් ජාතීන්ගේ සංවිධානය වැනි බහුපාර්ශ්වික සංවිධාන හරහා එක්සත් රාජධානිය ශ්‍රී ලංකාවට සහාය දැක්වීම පිළිබඳ සතුටු වන බවයි.එසේම, ණය තිරසාරභාවය යථා තත්ත්වයට පත් කිරීම සඳහා අනෙකුත් ණය දෙන්නන් සහ ශ්‍රී ලංකා රජය සමඟ එක්ව කටයුතු කිරීමට සූදානම් බව ද ඇය වැඩිදුරටත් පැවසුවාය.

රැස්වීමේදී අදහස් දැක්වූ ශ්‍රී ලංකා - එක්සත් රාජධානි පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමයේ අභිනව සභාපති, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු චන්දිම වීරක්කොඩි මහතා සංගමයේ සභාපතිවරයා ලෙස තමන්ව තෝරා පත් කර ගැනීම පිළිබඳව සිය කෘතඥතාව පළ කළේය. තවද මේ හරහා එක්සත් රාජධානි සහ ශ්‍රී ලංකාව අතර සබඳතා තවදුරටත් ශක්තිමත් කිරීමට සහ වර්ධනය කිරීමට කටයුතු කිරීමට තමන් අපේක්ෂා කරන බව ද ඒ මහතා ප්‍රකාශ කළේය.





# නිසි ක්‍රමවේදයක් පළමුව සකස් නොකර SVAT පහසුකම ඉවත් කළහොත් අපනයන කර්මාන්ත ක්ෂේත්‍රය තවදුරටත් කඩාවැටීම වැළැක්විය නොහැකියි - අපනයන කර්මාන්තකරුවෝ ආංශික අධීක්ෂණ කාරක සභාවට දැනුම් දෙති




ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ යෝජනාවකට අනුව රජය විසින් ක්‍රියාවට නැංවීමට නියමිත SVAT පහසුකම ඉවත් කිරීම සිදුකරන්නේ නම් ඊට පළමුව වැට් බදු ආපසු ගෙවීම සඳහා කාර්යක්ෂම යාන්ත්‍රණයක් පළමුව හඳුන්වා දිය යුතු බව අපනයන කර්මාන්තකරුවන්ගේ සංගම් සියල්ල ඊයේ පාර්ලිමේන්තුවේ පැවති ආර්ථික අර්බුදයේ බලපෑම සමනය කිරීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට දැනුම් දුන්හ.

එම කාරක සභාව එහි සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගාමිණී වලේබොඩ මහතාගේ ප්‍රධානත්වයෙන් මේ මස 21 වැනිදා රැස්වූ අතර මෙරට අපනයන කර්මාන්ත ක්ෂේත්‍රය නියෝජනය කරමින් ඒකාබද්ධ ඇඟලුම් නිෂ්පාදකයන්ගේ සංගමය, රබර් නිෂ්පාදන අපනයනකරුවන්ගේ සංගමය, තේ නිෂ්පාදන අපනයනකරුවන්ගේ සංගමය ඇතුළු සියලු ප්‍රධානපෙළේ අපනයනකරුවන්ගේ සංගම් සියල්ලෙහිම නියෝජිතයන්ද මුදල් අමාත්‍යාංශය, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් නිලධාරීන්ද සහභාගී වූ අතර SVAT පහසුකම ඉවත් කිරීමේ රජයේ තීරණය සම්බන්ධයෙන් දීර්ඝ ලෙස සාකච්ඡා විය.

මෙහිදී ලොව දියුණු රටවල ක්‍රියාත්මක බදුක්‍රමය මෙන් සාර්ථක බදු ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා මෙම තීරණය ගැනීමට රජය අපේක්ෂා කරන බව මුදල් අමාත්‍යාංශ නිලධාරීහු පෙන්වා දුන්හ. එහෙත් අපනයනකරුවන්ගේ සංගම් පෙන්වා දුන්නේ SVAT පහසුකම ඉවත් කිරීම සම්බන්ධයෙන් කිසිදු විරුද්ධත්වයක් නැතිවුවද ලොව දියුණු රටවල මෙන් මෙරට ද මේ සඳහා නිසි යාන්ත්‍රණයක් පළමුව ස්ථාපිත විය යුතු බවයි. වැට් බදු ප්‍රතිපූර්ණය/ ආපසු ගෙවීම් සඳහා විශාල කාලයක් ගතවීම නිසා එය අපනයනකරුවන්ගේ මුදල් ප්‍රවාහයට (cash flow) සෘජුවම හානිදායක ලෙස බලපාන බවත් 2016 වසරේ සෑඑෆ් පද්ධතිය ස්ථාපිත කොට බිලියන ගණනක් වැය කර වසර 7ක් ගතවුවද බදු එකතු කිරීම හා ආපසු ගෙවීම් සඳහා කාර්යක්ෂම ක්‍රමවේදයක් තවමත් ස්ථාපිත නොවීම ගැටලුවක් බවත් සාකච්ඡා විය.පනතට අනුව දින 45ක් තුළ බදු ප්‍රතිපූර්ණය/ආපසුගෙවීම සිදුවිය යුතු වුවද එසේ නොවන බව මෙහිදී පෙන්වා දුන්හ. මේ අනුව ඉක්මනින් බදුමුදල් ප්‍රතිපූර්ණය සඳහා නිලධාරීන් ද ඇතුලත් ඇතැම් තෙවන පාර්ශවයේ කණ්ඩායම් මැදිහත්ව තැරැව්කරුවන් ලෙස ක්‍රියාකරන මට්ටමට දූෂිත තත්ත්වයන්ද ඇති වී ඇති බව මෙම සංගම් නියෝජිතයෝ පෙන්වා දුන්හ.



SVAT පහසුකම ඉවත් කිරීමට අදාළ කැබිනට් තීරණයට අනුව මෙම පහසුකම ඉවත් කරන්නේ නම් ඊට පළමුව නිසි ක්‍රමවේදයක් ස්ථාපිත කළයුතු බව දැනුම් දී ඇති බවත් මෙහිදී අනාවරණය විය.

SVAT ක්‍රමය හරහා රජයට ආදායම් අහිමිවීමක් සිදුවන බව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පවසා සිටියද එය නිවැරදිව තහවුරු කිරීමට ප්‍රමාණවත් සංඛ්‍යා දත්ත ඉදිරිපත් නොකිරීම ගැටලුවක් බව කමිටුව පෙන්වා දුන්නේය. එබැවින් මේ සම්බන්ධ වාර්තාවක් සතියක් තුළ කමිටුවට ලැබීමට සලස්වන ලෙස කමිටු සභාපති වලේබොඩ මහතා දැනුම් දුන්නේයි එසේම මෙම SVAT පහසුකම ඉවත්කරන්නේ නම් වැට් බදු ප්‍රතිපූර්ණය සඳහා විකල්ප වැඩපිළිවෙල කුමක්ද යන්නත් පැහැදිලිව ඉදිරිපත් කරන ලෙස උපදෙස් දුන්නේය. තවද මේ හරහා අපනයන කර්මාන්ත ක්ෂේත්‍රයට සිදුකරන බලපෑම සියලු ප්‍රමාණාත්මක දත්ත සහිතව සම්පූර්ණ වාර්තාවක් ලෙස සතියක් තුළ කමිටුවට ඉදිරිපත් කරන ලෙස අපනයන කර්මාන්තකරුවන්ට ද දැනුම් දුන්නේය. මෙරට ආර්ථිකය වෙනුවෙන් සුවිසල් කාර්ය භාරයක් ඉටුකරන අපනයන කර්මාන්ත ආරක්ෂා කරගැනීම ජාතික වගකීමක් වන බැවින් මෙම ආංශික අධීක්ෂණ කාරක සභාව ඒ සඳහා නිරතුරුව පෙනී සිටින බව කාරක සභා සභාපතිවරයා අවධාරණය කළේය. මෙම සියලු කරුණු කාරණා අනුව මේ පිළිබඳ නිර්දේශ පාර්ලිමේන්තුව හරහා රජයට ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන බව කාරක සභා සභාපතිවරයා වැඩිදුරටත් පවසන ලදී.

# ගුරු සේවයේ සිට සේවාස්ථ උපදේශක සේවයට අන්තර්ග්‍රහණය කිරීමේදී වැටුප් සම්බන්ධයෙන් ඇතිව තිබෙන ගැටලුව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ අවධානය




ගුරු සේවයේ සිට සේවාස්ථ උපදේශක සේවයට අන්තර්ග්‍රහණය වීමේදී පොරොන්දු වූ වැටුප සහ ලබා දෙනු ලබන වැටුප් ශ්‍රේණිය අතර පවතින විෂමතාවය සම්බන්ධයෙන් අධ්‍යාපනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ අවධානය යොමු විය.

මේ පිළිබඳ සාකච්ඡා කෙරුණේ අධ්‍යාපනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව පාර්ලිමේන්තු මන්ත්‍රී (ආචාර්ය) ගරු වී. රාධක්‍රිෂ්ණන් මහතාගේ සභාපතිත්වයෙන් මේ මස 11 වැනිදා පාර්ලිමේන්තුවේදී රැස්වූ අවස්ථාවේදීය.

මේ අනුව මෙම ගැටළු සඳහා විසඳුම් ලැබෙන තුරු පත්කිරීම් තාවකාලිකව කල් දැමිය යුතු බව කමිටුවේ අදහස වූ අතර සිය සේවා කාලය තුළ උපදේශකයෙකු ලෙස අන්තර්ග්‍රහණය වන විට පෙර ලැබුණු වැටුපට වඩා අඩු වැටුපක් ලබා දීම සාධාරණ නොවන බවද කමිටුවේ අදහස විය.

මෙහිදී විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මහතා විසින් ගුරු උපදේශක සේවා තනතුරු වල පවතින පුරප්පාඩු 1,982 පිරවීමට ගෙන ඇති ක්‍රියාමාර්ග සහ ගුරු උපදේශක තනතුරුවල රාජකාරිය සහ විෂය පථය සම්බන්ධයෙන් ද පැමිණ සිටි නිලධාරීන්ගෙන් විමසා සිටියේය.

ඒ අනුව ගැටලු රැසක් පවතින තත්ත්වය තුළ ගුරුවරුන් උපදේශක සේවයට අන්තර්ග්‍රහණය කර ගැනීමට කටයුතු කරීමට උත්සහ කිරීම අනුමත කළ නොහැකි බවත් ඒ සම්බන්ධයෙන් තවදුරටත් සාකච්ඡා කළ යුතු බවත් කමිටුවේ අදහස විය.

එසේම පෙර පාසල් ක්‍රියාකාරීත්වය සහ පෙර පාසල් අධ්‍යාපනය වඩා විධිමත් කළ හැකි ආකාරය පිළිබඳව ද මෙහිදී සාකච්ඡාවට ලක් කෙරුණි. මේ සම්බන්ධයෙන් පැමිණ සිටි නිලධාරීන් පෙන්වා දුන්නේ මහජන අදහස් ලබාගැනීමේ අරමුණෙන් මාසයකට ආසන්න කාලයක් පෙර පාසල් අධ්‍යාපනය සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය අධ්‍යාපන අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළ කර තිබූ බවයි. ඒ අනුව පෙර පාසල් අධ්‍යාපනය සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය ඇතුළත් ක්‍රියාකාරී සැලැස්මක් අදාළ ආයතන සහ දෙපාර්තමේන්තුවල සියලු දෙනාගේ සහභාගීත්වයෙන් මේ වන විට කෙටුම්පත් කර ඇති බවද පැමිණ සිටි නිලධාරීහු පැවසූහ.

තවද පෙර පාසල් අධ්‍යාපනය සම්බන්ධයෙන් පළාත් වශයෙන් විවිධ ප්‍රතිපත්ති ක්‍රියාත්මක වන බැවින් මේ සම්බන්ධයෙන් පොදු ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම වැදගත් වන බව කමිටුවේ අදහස විය. එසේම මුල් ළමාවිය අධ්‍යාපනය සම්බන්ධයෙන් ද මෙහිදී සාකච්ඡා කෙරුණු අතර ඉරිදා දිනවල පැවැත්වෙන පෞද්ගලික උපකාරක පන්ති නියාමනය කිරීම සම්බන්ධයෙන්ද මෙහිදී සාකච්ඡා විය.

තවද පාසැල් විෂය නිර්දේශවල කාන්තාවන්ට වෙනස් කොට සැලකීම සාධාරණීකරණය කරන අන්තර්ගතයන් අඩංගු වන බවට නිරීක්ෂණය වන බැවින් පාසල් විෂය නිර්දේශයේ අන්තර්ගත ඇතැම් පරිච්ඡේද පිළිබඳව සොයා බැලිය යුතු බවද කමිටුවේ අදහස විය. ඒ අනුව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වැඩසටහනට සමගාමීව මෙම කරුණු පිළිබඳව ද සලකා බලන ලෙසට කමිටුව නිර්දේශ කරනු ලැබිය.

මීට අමතරව දිවා ආහාර වැඩසටහනේ ප්‍රගතිය පිළිබඳව කමිටුව විමසා සිටි අතර මෙහිදී පැමිණ සිටි නිලධාරීන් පෙන්වා දුන්නේ සිසුන් ලක්ෂ 18කට එනම් පාසැල් 7,926ක් ආවරණය වන පරිදි දිවා ආහාරය ලබාදීමට කටයුතු කරන බවයි.



# මෙරටට බස් රථ ගෙන්වීම පිළිබඳ අවම ප්‍රමිතියක් නියම කිරීමේ නිර්නායක බලශක්ති හා ප්‍රවාහනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී අනුමත කෙරේ

**■මෙරට ධාවනය කෙරෙන වාහන වලින් 90%ක වායු විමෝචනය ප්‍රමිතියෙන් තොරයි**



මෙරට ධාවනය කෙරෙන වාහන වලින් 90% ක වායු විමෝචනය ප්‍රමිතියෙන් තොර බව පාර්ලිමේන්තුවේ බල ශක්ති හා ප්‍රවාහන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී අනාවරණය විය.

උක්ත කාරක සභාව එහි සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී (ඉංජිනේරු) ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතාගේ ප්‍රධානත්වයෙන් මේ මස 22 වැනිදා පාර්ලිමේන්තුවේදී රැස්වූ අතර ආංශික අධීක්ෂණ කාරක සභා සඳහා තෝරා ගන්නා ලද තරුණ නියෝජිතයන්ද කාරක සභාවට සහභාගී විය.



මෙරටට මගී ප්‍රවාහන බස් රථ ගෙන්වීම සඳහා අවම ප්‍රමිතියක් සකස් කිරීමට අදාල යෝජනාව ප්‍රවාහන අමාත්‍යාංශය විසින් කමිටුව වෙත ඉදිරිපත් කළ අතර, ඒ පිළිබඳ එහිදී දීර්ඝ වශයෙන් සාකච්ඡා කෙරිණි. මෙරටට මගී බස් රථ ආනයනය කිරීමේදී අවම ප්‍රමිතියක් සකස් කිරීමට කමිටු රැස්වීම කැඳවා තිබු අතර, ඒ සඳහා ආයතන 18 ක් කැඳවා තිබිණි. ඒ පිළිබඳ දීර්ඝ සාකච්ඡා කිරීමකින් අනතුරුව ඉදිරියේදී මෙරටට මගී බස් රථ ආනයනය කිරීමේදී කමිටුව තීරණය කළ නිර්ණායකවලට අනුකූලව බස් රථ ගෙන්විය යුතු බවට කමිටුවේදී තීරණය විය.

ලංකාවේ ධාවනය කෙරෙන වාහනවලින් 90% ක් වායු විමෝචන ප්‍රමිතියෙන් තොර බවත් වාර්ෂිකව වායු විමෝචනයට ඉදිරිපත් කෙරෙන වාහනවලින් 20% ක් වායු විමෝචනය අසමත් වන බවද කමිටුවේදී හෙළි විය. ලංකාවේ ධාවනය කෙරෙන වාහනවලින් 90% කින්ම අහිතකර වායු පරිසරයට මුදා හරින බව හෙළිවිය.



කමිටුවට සහභාගිවූ ආයතනය ඊට අදාල කරුණු ඉදිරිපත්කළ අතර කමිටු සභාපති නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා අදාල අංශවලට නියෝග කළේ මගී ප්‍රවාහන බස් රථ ආනයනය සහ වාහන වල වායු විමෝචනය අධීක්ෂණය පරීක්ෂණය සහ නියාමය පිළිබඳව කරුණු ඇතුලත් වාර්තාවක් මාස දෙකක් ඇතුළත කමිටුවට ඉදිරිපත් කරන ලෙසයි.





# චීන සහ තායිලන්ත ජාතිකයින් අයථා ලෙස මෙරට මැණික් ගල් ඉතා අඩු වටිනාකමට ක්ෂේත්‍රයේදීම මිලදී ගැනීම හේතුවෙන් රජයට අපේක්ෂිත බදු මුදල් නොලැබීමේ ප්‍රවණතාවක්

■මැණික් ප්‍රතිඅපනයන සඳහා ආනයනය කිරීමේදී පනවා ඇති 2.5% ක සමාජ ආරක්ෂණ බද්ද ඉවත් කිරීමට පියවර

■පරිසරය, ස්වාභාවික සම්පත් සහ තිරසාර සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී සාකච්ජා කෙරේ



චීන, තායිලන්ත ජාතිකයින් විසින් අයථා මුදල් යොදා ගනිමින් අයථා ලෙස මෙරට මැණික් ගල් ඉතා අඩු වටිනාකමට ක්ෂේත්‍රයේදීම මිලදී ගැනීම හේතුවෙන් රජයට අපේක්ෂිත බදු මුදල් නොලැබෙන බව පරිසරය, ස්වාභාවික සම්පත් සහ තිරසාර සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී අනාවරණය විය. මේ නිසා රජයට නිසි පරිදි බදු මුදල් ගෙවමින් සාධාරණ ලෙස සිය ව්‍යාපාරය පවත්වාගෙන යන මැණික් ව්‍යාපාරිකයින්ට අසාධාරණයක් සිදුවන බවද මෙහිදී සාකච්ඡා විය.

මේ පිළිබඳ සාකච්ඡා වූයේ ස්වාභාවික සම්පත් සහ තිරසාර සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව මැණික් සහ ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ ආනයනය, අපනයනය සහ ප්‍රතිඅපනයනය සම්බන්ධයෙන් වන ගැටළු පිළිබඳ සාකච්චඡා කිරීම සඳහා එම කමිටුව මේ මස කමිටු සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී අජිත් මාන්නප්පෙරුම මහතාගේ ප්‍රධානත්වයෙන් පාර්ලිමේන්තුවේදී රැස්වූ අවස්ථාවේදීය.

මැණික් සහ ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ නියැලී සිටින ව්‍යාපාරික සංගම් නියෝජිතයින්, මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ සභාපති ඇතුළු නිලධාරීන්, මුදල් හා ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ නිලධාරීන්, ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහ ජනාධිපති ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම් (කෘෂිකර්ම සහ පරිසර) මෙම කමිටුවට කැඳවා තිබිණි.

ශ්‍රී ලංකාවේ මැණික් සඳහා විදේශ රටවල් අතර පැවැති කීර්තිමත් නාමය නැවත ඇති කර ගැනීම සඳහා කටයුතු කිරීම සහ මැණික් අපනයනයෙන් සහ ප්‍රතිඅපනයනයෙන් මෙරටට විදේශ විනිමය ලබා ගැනීමට කටයුතු කිරීම මෙම සාකච්ඡාවල ප්‍රධාන අපේක්ෂාව බව කාරක සභාවේ ගරු සභාපති අජිත් මාන්නප්පෙරුම මහතා මෙහිදී පෙන්වා දුන්නේය.

මැණික් ප්‍රතිඅපනයන සඳහා ආනයනය කිරීමේදී පනවා ඇති 2.5% ක සමාජ ආරක්ෂණ බද්දෙන් එම ක්‍රියාවලිය නිදහස් කිරීමට දැනටමත් සංශෝධිත පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇති බව මුදල් අමාත්‍යාංශයේ නිලධාරීන් පෙන්වා දුන් අතර ඉදිරියේදී එම සහනය ව්‍යාපාරිකයින්ට ලබාදීමට නියමිතය. මැණික් ප්‍රතිඅපනයනය සඳහා කුරියර් මඟින් ආනයනය කිරීමේදී මෙලෙස 2.5% ක බදු මුදලක් ගෙවීමට සිදුවුවද ඇමරිකානු ඩොලර් 200ක් පමණක් ගෙවීමෙන් ඉතා විශාල වටිනාකමකින් යුත් මැණික් තොගයක් වුවද අතෙහි ගෙන ඒමට (Hand luggage) හැකි බව ද මෙහිදී අනාවරණය විය. මැණික් ව්‍යාපාරිකයින්ගෙන් මැණික් අපනයනයේදී ලාභය මත අයකරනු ලබන 30%ක ආදායම් බද්ද පිරිවැටුම මත 2.5% වශයෙන් අයකිරීමට ඇති හැකියාව සලකා බලන ලෙසද ව්‍යාපාරිකයින් මෙහිදී ඉල්ලා සිටියහ.





මෙහිදී කාරක සභාවට සහභාගී වූ ශ්‍රී ලංකා රේගුවේ නිලධාරීන් පවසා සිටියේ "TIEP Scheme" නම් ක්‍රමවේදය යටතේ (අපනයන සැකසුම් සඳහා තාවකාලික ආනයනය) ස්වර්ණාභරණ ව්‍යාපාරිකයින්ට අවශ්‍ය වන රත්‍රං අමුද්‍රව්‍යයක් ලෙස කර්මාන්ත අමාත්‍යාංශයේ ලියාපදිංචි වීම මඟින් බදු අයකිරීමෙන් තොරව මෙරටට ගෙන්වා ගත හැකි බවයි නමුත් මෙම ක්‍රියාවලියේ පවතින සංකීර්ණභාවය හේතුවෙන් ව්‍යාපාරිකයින් ඒ සඳහා සිය අකමැත්ත ප්‍රකාශ කරන ලදී.

සිය ව්‍යාපාර කටයුතු පහසුකර ගැනීම සඳහා ශ්‍රී ලංකවේ බැංකුවක් චීනයේ පිහිටුවීම හෝ චීනයේ බැංකුවක් ශ්‍රී ලංකාවේ පිහිටුවීම සම්බන්ධව මැණික් ව්‍යාපාරිකයින්ගෙන් ලද යෝජනාව කෙරෙහි ද කාරක සභාව සිය අවධානය යොමු කළේය. මෙහිදී ශ්‍රී ලංකා මහ බැංකුව නියෝජනය කරමින් පැමිණි නිලධාරියා පැවසුවේ 2018 වර්ෂයේ සිට "Bank of Chin" ලංකාවේ ක්‍රියාත්මක වන අතර ලංකාවේ බැංකුවක් චීනයේ පිහිටුවීම දැනට ලංකාව මුහුණපා සිටින ආර්ථික අර්බුදය හමුවේ අපහසු බවයි.

රු.500,000/= වඩා වැඩි මුදල් ගණුදෙණු සිදු කිරීමේදී රජය විසින් අයකරනු ලබන බදු මුදල්වලින් බේරීම සඳහා බොහෝවිට ක්ෂේත්‍රයේ සිටින මැණික් ව්‍යාපාරිකයින් මෙවැනි වැඩි වටිනාකමකින් යුතු මුදල් ගණුදෙනු අත්පිට මුදලට සිදුකිරීමට පෙළඹී ඇති අතර, මේ නිසා සාධාරණ ලෙස බැංකු හරහා මුදල් ගණුදෙණු කර නිසි ලෙස බදු මුදල් රජයට ගෙවන ව්‍යාපාරිකයින්ට ක්ෂේත්‍රයෙන් ඉවත්ව යාමට සිදුව තිබේ. විදේශීය ජාතිකයින් මෙරට මැණික් කර්මාන්තය ආක්‍රමණය කිරීම නියාමනය කිරීමට දැනට ප්‍රතිපත්ති සම්පාදනය කරන බව මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ සභාපති කාරක සභාව හමුවේ පැවසූ අතර අදාල ප්‍රතිපත්ති කඩිනමින් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය කාරක සභාව විසින් අවධාරණය කරන ලදී. රත්‍රං ආනයනය කිරීමට අපනයනකරුවන්ගේ පෙර වසරවල අපනයන ඉපැයීම් හෝ විදේශ මුදල් ඉපැයීම්වලින් 30%ක් පදනම් කර ගෙන බලපත්‍රයක් මඟින් බදු අයකිරීමෙන් තොරව අවසර ලබාදෙන ලෙස ස්වර්ණාභාරණ ව්‍යාපාරිකයින් ඉල්ලා සිටි අතර මුදල් අමාත්‍යාංශයේ නිලධාරීන් පෙන්වා දුන්නේ ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි වී සිටින ව්‍යාපාරිකයින් සඳහා අවශ්‍යවන රත්‍රං අපනයන සැකසුම් සඳහා තාවකාලික ආනයනයට බලපත්‍රයක් ලබාගෙන ආනයනය කිරීමේ බාධාවක් දැනට නොමැති අතර කැරට් 24 රත්‍රං ආභරණ ආනයනය කිරීම පමණක් නවතා ඇති බවය.





# රෝගීන්ගේ අයිතිවාසිකම් හා වගකීම් වඩාත් ශක්තිමත් කිරීමට සෞඛ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවෙන් යෝජනාවලියක්




රෝගීන්ගේ අයිතිවාසිකම් හා වගකීම් වඩාත් ශක්තිමත් කිරීමට සෞඛ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවෙන් යෝජනාවලියක් සැකසීම පිළිබඳ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මයන්ත දිසානායක මහතාගේ සභාපතිත්වයෙන් මේ මස 11 වන දින රැස්වූ සෞඛ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී සාකච්ඡා විය.

සෞඛ්‍ය අමාත්‍යාංශය, අධිකරණ අමාත්‍යාංශය, ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය, ශ්‍රී ලංකා වෛද්‍ය සභාව, නීති ආධාර කොමිෂන් සභාව, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව යන රාජ්‍ය ආයතන ද රෝගීන්ගේ අයිතිවාසිකම් සුරැකීම නියෝජනය කරමින් තවත් ආයතන රැසක නියෝජිතයන් ද කමිටු සාකච්ඡාවට සහභාගී වූ අතර දැනට රෝගීන්ගේ අයිතිවාසිකම් සුරැකීම සඳහා පවතින නීති රෙගුලාසි තවත් ශක්තිමත් කිරීම පිළිබඳ අදහස් හුවමාරු විය.

අටවැනි පාර්ලිමේන්තුවේ, සෞඛ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කමිටුවේ සාකච්ඡා වූ රෝගීන්ගේ අයිතිවාසිකම් හා වගකීම් පිළිබඳ යෝජනාවලිය තව දුරටත් සාකච්ඡා කොට එය පාර්ලිමේන්තුවේ සම්මත කිරීමේ අවශ්‍යතාවය කමිටුව විසින් පෙන්වා දුන්නේය. මේ සම්බන්ධයෙන් කමිටුවට සහභාගී වූ වෛද්‍ය වෘත්තීයට අදාල විද්වත් පිරිස් සහ රෝගීන්ගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් පෙනී සිටින අනෙකුත් ආයතන විසින් මේ පිළිබඳ පුළුල්ව සාකච්ඡාවට භාජනය කරන ලදි. දැනට සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කර ඇති උක්ත කරුණු සම්බන්ධ යෝජනාවලිය සහ ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය විසින් ඉදිරිපත් කර ඇති යෝජනාවලිය එකිනෙකට සසඳා බලා අවසාන යෝජනාවලියක් සැකසීමට මෙහිදී කමිටුව විසින් තීරණය කරන ලදි.

මෙම කටයුත්ත සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානයේ තාක්ෂණික සහය ලබා දීමට එම සංවිධානයේ ශ්‍රී ලංකා කාර්යාල නියෝජිත Dr.Shalala Ahmadova මහත්මිය එකඟ විය.

එසේම ඉන්දියාව, තායිලන්තය වැනි රටවල තිබෙන මේ හා සම්බන්ධ යෝජනාවලීන් ද අධ්‍යනය කර මෙම යෝජනාවලිය තවත් ශක්තිමත් කර ගැනීමට එම යෝජනාද දායක කර ගන්නා ලෙසද කමිටුව යෝජනා කළේය.






# ඉන්දියාව බංගලාදේශය මාලදිවයින ඇතුළු සාර්ක් කලාපීය රටවල් වෙනුවෙන් විශේෂ වීසා කාණ්ඩයක් සකස්කිරීමේ අවශ්‍යතාව පිළිබඳ ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික

- **විදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ සීමාවාසික පුහුණු වැඩසටහනක් (Internship Program) ආරම්භ කිරීම පිළිබඳ අවධානය**
- **විදේශගත ශ්‍රී ලාංකිකයින්ට ඡන්දය භාවිත කිරීමට ක්‍රමවේදයක් සකස් කිරීම පිළිබඳ අවධානය**



ඉන්දියාව, බන්ගලාදේශය සහ මාලදිවයින ඇතුළු සාර්ක් කලාපීය රටවල් වෙනුවෙන් විශේෂ වීසා කාණ්ඩයක් සකස්කිරීමේ අවශ්‍යතාව පිළිබඳ ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී සාකච්ඡා විය.

මේ පිළිබඳ සාකච්ඡා කෙරුණේ ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නාමල් රාජපක්ෂ මහතාගේ සභාපතිත්වයෙන් මේ මස 08 වැනිදා පාර්ලිමේන්තුවේදී රැස්වූ අවස්ථාවේදීය.

මෙහිදී සාර්ක් කලාපීය රටවල් වෙනුවෙන් ශ්‍රී ලංකාවේ පවතින විදේශ ප්‍රතිපත්තිය පිළිබඳව සාකච්ඡා වූ අතර මෙම කමිටුවේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නාමල් රාජපක්ෂ මහතා පෙන්වා දුන්නේ ඉන්දියාව, බංගලාදේශය, මාලදිවයින වැනි සාර්ක් කලාපීය රටවල් වෙනුවෙන් අධ්‍යාපන සහ සෞඛ්‍ය යන ක්ෂේත්‍ර වල විශේෂ වීසා කාණ්ඩයක් සකස් කිරීම වැදගත් වන බවයි. මේ නිසා සහනදායී ආකාරයට මෙම රටවල් වෙනුවෙන් වීසා ලබාදීමේ ක්‍රමවේදයක් සකස් කිරීමට කමිටුව ලෙස යෝජනා කරන බව හෙතෙම සඳහන් කළේය.



එසේම විදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ විවිධ වැඩසටහන් වෙනුවෙන් සකස්වූ සීමාවාසික පුහුණු වැඩසටහනක් (Internship Program) ආරම්භ කිරීමේ ක්‍රමවේදයක් සකස් කිරීම පිළිබඳ අවධානය යොමු කරන ලෙස කාරක සභාව විදේශ කටයුතු අමාත්‍යාංශයට යෝජනා කළේය. මේ අනුව සියලුම ක්ෂේත්‍ර නියෝජනය වන පරිදි මෙම වැඩසටහන සංවිධානය විය යුතු බවත් ඒ සඳහා විදේශීයකයන්ටද සම්බන්ධවීමේ හැකියාව පැවතිය යුතු බව කමිටුව පෙන්වා දුන්නේය.

මෙහිදී චක්‍රලේඛණයකට අනුව විදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ අභ්‍යන්තර පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක වන බව පැමිණ සිටි නිලධාරීහු පැවසූහ. නමුත් මීට වඩා විධිමත් ආකාරයෙන් විවෘත වැඩසටහනක් ලෙස මෙම වැඩසටහන සකස් විය යුතු බව මෙම කමිටුවේ සභාපති ගරු නාමල් රාජපක්ෂ මහතා පෙන්වා දුන්නේය.

තවද විදේශගත ශ්‍රී ලාංකිකයින්ට ඡන්දය භාවිත කිරීමට ක්‍රමවේදයක් සකස් කිරීම පිළිබඳවද මෙහිදී සාකච්ඡා වූ අතර මෙහිදී ජාතික මැතිවරණ කොමිෂන් සභාවේ නිලධාරීන් පෙන්වා දුන්නේ ව්‍යවස්ථාදායකය ලබාදෙන ඕනෑම නිර්දේශයක් අනුව අවශ්‍ය යාන්ත්‍රණය සකස් කිරීමට මැතිවරණ කොමිෂන් සභාව සූදානම් බවයි. එසේම මාර්ගගත (on-line registration) තාක්ෂණය ඔස්සේ ඡන්දය ලබාදීමට ලියාපදිංචිවීමේ ක්‍රමවේදයක් ද මේ වන විට සකස්කොට ඇති බව බවත්, ඒ ඔස්සේ විදෙස්ගත ලාංකිකයන්ටද ඡන්දය ලබාදීම පිණිස ලියාපදිංචි වීමේ හැකියාව ඇති බවත් ඔවුහු පෙන්වා දුන්නේය. මේ අනුව ගරු කථානායකවරයා සමගද සාකච්ඡා කොට මේ වෙනුවෙන් ක්‍රමවේදයක් සකස් කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නාමල් රාජපක්ෂ මහතා පෙන්වා දුන්නේය.

එසේම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙනුවෙන් විදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ දැනුවත් කිරීමේ සහ පුහුණු වැඩසටහන් කිහිපයක් සංවිධානය කිරීම පිළිදවද මෙහිදී සාකච්ඡා විය.

# චිත්‍රපට කර්මාන්තය දියුණු කිරීම සම්බන්ධයෙන් ආංශික අධීක්ෂණ කාරක සභාවේදී



මෙරට චිත්‍රපට කර්මාන්තය දියුණු කිරීම සම්බන්ධයෙන් මාධ්‍ය, තාරුණ්‍ය, උරුමය හා නූතන පුරවැසියා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී සාකච්ඡා විය.

මේ පිළිබඳ සාකච්ඡා කෙරුණේ චිත්‍රපට ක්ෂේත්‍රයේ පවතින ගැටලු සහ ඉදිරි යෝජනා සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මෙම කාරක සභාව පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ලලිත් වර්ණ කුමාර මහතාගේ සභාපතිත්වයෙන් මේ මස පාර්ලිමේන්තුවේදී රැස් වූ අවස්ථාවේදීය. මෙහිදී මේ පිළිබඳ සාකච්ඡා කිරීමට ජාතික චිත්‍රපට සංස්ථාවේ නිලධාරීන් මෙම කාරක සභාවට කැඳවා තිබුණි.

මේ අනුව චිත්‍රපට ක්ෂේත්‍රයේ පවතින ගැටලු පිළිබඳව ජාතික චිත්‍රපට සංස්ථාව නියෝජනය කරමින් පැමිණි නිලධාරීන් පැහැදිලි කළේය. විශේෂයෙන්ම මෙහිදී ඔවුහු පෙන්වා දුන්නේ සිනමාව හැකිලෙමින් යන ප්‍රවණතාවක් මේ වන විට ඇති වී තිබෙන බවත් වසරකට සිනමා ශාලා 5ක් හෝ 6ක් පමණ වැසී යන බවත්ය.

එසේම චිත්‍රපට ප්‍රවේශ පත්‍රයකින් චිත්‍රපට සංස්ථාවට ලැබෙන මුදල් කොටස පිළිබඳව සහ චිත්‍රපට නිෂ්පාදකයන් සොයාගැනීම සම්බන්ධයෙන් පවතින අපහසුතාව පිළිබඳවද මෙහිදී සාකච්ඡා කෙරුණි.

චිත්‍රපට සංස්ථා පනත සංශෝධනය කිරීම සම්බන්ධයෙන්ද මෙහිදී දීර්ඝ වශයෙන් සාකච්ඡා විය. එසේම විදේශීය චිත්‍රපට ගෙන්වීමට ලියාපදිංචි වන මුදල සහ එක් චිත්‍රපටයක් වෙනුවෙන් චිත්‍රපට සංස්ථාව අයකරගන්නා මුදල සංශෝධනය විය යුතු බවද මෙහිදී යෝජනා විය. මීට අමතරව නෙට්ෆ්ලික්ස් වැනි වේදිකාවන් ජනප්‍රිය වීම තුළ ඒවාට මුහුණ දීමට චිත්‍රපට සංස්ථාවේ පවතින සැලසුම් පිළිබඳවද මෙහිදී කමිටුවේ අවධානය යොමු විය.

තවද චිත්‍රපට නිර්මාණකරුවන් ගුණාත්මක තත්ත්වයේ චිත්‍රපට සකස්කිරීමේ අවශ්‍යතාව සම්බන්ධයෙන්ද පැමිණ සිටි නිලධාරීන් මෙහිදී පෙන්වා දුන්නේය.





# විවෘත සහ වගකිවයුතු රජයක් සඳහා වන ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත ගරුතර ස්වාමීන්වහන්සේලාගේ අදහස් ලබා ගනී

විවෘත සහ වගකිවයුතු රජයක් සඳහා වන ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත ගරුතර ස්වාමීන්වහන්සේලාගේ අදහස් ලබා ගැනීම පාර්ලිමේන්තුවේදී සිදු විය.




මෙම අදහස් ලබාගැනීම සිදු වූයේ විවෘත සහ වගකිවයුතු රජයක් සඳහා වන ආංශික අධීක්ෂණ කාරක සභාව එහි සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතාගේ සභාපතිත්වයෙන් මේ මස 03 වැනිදා පාර්ලිමේන්තුවේදී රැස් වූ අවස්ථාවේදීය.

මෙහිදී විවෘත සහ වගකිව යුතු රජයක් සකස්කිරීම සඳහා සම්පාදනය විය යුතු අණ පනත් පිළිබඳව සහ සංශෝධනය විය යුතු අණ පනත් පිළිබඳව පැමිණ සිටි ස්වාමීන් වහන්සේලා විසින් සිය අදහස් සහ යෝජනා ඉදිරිපත් කරන ලදි.

එසේම මෙහිදී රටේ සෑම අංශයක් සම්බන්ධයෙන්ම ජාතික ප්‍රතිපත්ති සකස් කිරීමේ අවශ්‍යතාවය ගරුතර ස්වාමීන්වහන්සේලා පෙන්වා දුන්හ. විශේෂයෙන්ම දේශපාලන ප්‍රතිපත්තිය සහ ජාතික ප්‍රතිපත්තිය පටලවා නොගෙන සෑම ආණ්ඩුවක් විසින්ම අඛණ්ඩව ක්‍රියාත්මක කරන ජාතික ප්‍රතිපත්තියක් මෙරටට වැදගත් වන බව උන්වහන්සේලා පෙන්වා දෙන ලදි.

එසේම අන්‍යාගමික සංවිධානවල අවශ්‍යතාව මත ස්වාමීන් වහන්සේලා සම්බන්ධයෙන් ගොඩනගන වෛරී ප්‍රකාශන සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීමට නෛතික පියවර ගැනීමේ අවශ්‍යතාවද මෙහිදී ස්වාමීන්වහන්සේලා පෙන්වා දුන්හ.



මෙම ඉදිරිපත් කළ කරුණු සම්බන්ධයෙන් මෙම කමිටුවට සිදු කළ හැකි මැදිහත්වීම සිදු කිරීමට කටයුතු කරන බව කාරක සභාවේ සභාපතිවරයා මෙහිදී පැවසීය. එසේම මෙම ඉදිරිපත් කළ යෝජනා සම්බන්ධ වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බවද ඒ මහතා පෙන්වා දුන්නේය.

මෙම කාරක සභාව සඳහා අති පූජ්‍ය ආණමඩුවේ ධම්ම දස්සි නාහිමි, අති පූජ්‍ය පහමුනේ සුමංගල නාහිමි, අති පූජ්‍ය (ආචාර්ය) වලේබොඩ ගුණසිරි නාහිමි, අති පූජ්‍ය (ජ්‍යෙෂ්ඨ මහාචාර්ය) කිවුලේ ගෙදර නාරද නාහිමි, අති පූජ්‍ය (ජ්‍යෙෂ්ඨ මහාචාර්ය) ඉඳුරාගාරේ ධම්මරතන නාහිමි, අති පූජ්‍ය (මහාචාර්ය) පින්නවල සංඝසුමන නාහිමි, අති පූජ්‍ය (මහාචාර්ය) නාඹිරිත්තන්කඩවර ඥානරතන නාහිමි, අති පූජ්‍ය (මහාචාර්ය) මැදගොඩ අබයතිස්ස නාහිමි, අති පූජ්‍ය (ආචාර්ය) කුඹල්ගොඩ ධම්මාලෝක නාහිමි, අති පූජ්‍ය කන්දේගම දීපවංශාලංකාර නාහිමි සහ අති පූජ්‍ය අකුරටියේ නන්ද නාහිමි සහභාගී වූහ.



# මත්පැන් බෝතල්වල ව්‍යාජ ස්ටිකර් හඳුනා ගැනීමේ ජංගම යෙදවුම කඩිනමින් ක්‍රියාත්මක කරන්න

## ක්‍රම හා විධි පිළිබඳ කාරක සභාවෙන් සුරාබදු දෙපාර්තමේන්තුවට උපදෙස්



මත්පැන් බෝතල්වල අලවා ඇති ආරක්ෂිත ස්ටිකර්වල ව්‍යාජ ඒවා හඳුනා ගැනීමට පාරිභෝගිකයන්ට හා ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවට හැකිවන පරිදි පවතින ජංගම යෙදවුම වැඩි දියුණු කරන ලෙස ක්‍රම හා විධි පිළිබඳ කාරක සභාවේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු පාඨලී චම්පික රණවක මහතා ආරක්ෂක ස්ටිකර් නිෂ්පාදන සමාගම වෙත නියෝග කළේය.

උක්ත කාරක සභාව පසුගිය මස 24 වැනිදා සුරාබදු දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ චාරිකාවක නිරත වූ අතර, එහිදී වෙළෙඳ පොළේ පවතින මත්පැන් බෝතල්වල අලවා ඇති ස්ටිකර් සත්‍ය ඒවාද ව්‍යාජ ඒවාද යන්න හඳුනාගැනීමේ ක්‍රමවේදයක් නොමැතිබවට නිරීක්ෂණය කර තිබිණි. ඒ සම්බන්ධයෙන් වැඩිදුර විමර්ශනය කිරීම සඳහා ක්‍රම හා විධි පිළිබඳ කාරක සභාව ගරු පාඨලී සම්පිකරණවක මහතාගේ ප්‍රධානත්වයෙන් මේ මස 10 වැනිදා පාර්ලිමේන්තුවේදී රැස්විය. කාරක සභාවට සුරාබදු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහ ආරක්ෂක ස්ටිකර් නිෂ්පාදන සමාගමක නියෝජිතයෙකු කැඳවා තිබිණි.

මත්පැන් බෝතල්වල ආරක්ෂිත ස්ටිකර් ඇලවීම අනිවාර්ය කළද එම උපදෙස් දිවයිනේ සියලුම මත්පැන් නිෂ්පාදකයින් අනුගමනය නොකිරීම සම්බන්ධයෙන් කමිටු සාමාජිකයන්ගේ අප්‍රසාදය පළ විය. එම ස්ටිකර් භාවිත නොකරන සමාගම් හතරක් මේ වන විට හඳුනාගෙන ඇති බව දෙපාර්තමේන්තුවේ නිලධාරීහු පෙන්වා දුන්හ.

මෙම ව්‍යාජ ස්ටිකර් සහිත මත්පැන් බෝතල් හඳුනාගැනීම සඳහා විශේෂ උපකරණ 200ක් පසුගිය මාර්තු මාසයේදී සුරාබදු දෙපාර්තමේන්තුවට ලබාදී ඇතත් මේ දක්වා එම උපකරණ භාවිත කර නොමැති බවද මෙහිදී අනාවරණය විය. එම උපකරණ ප්‍රායෝගිකව භාවිතා කළ හැකි මට්ටමට තාක්ෂණික වශයෙන් වැඩි දියුණු කිරීම මේ මස (අගෝස්තු) 30 වැනි දින වන විට සම්පූර්ණ කරන ලෙස අදාළ සමාගම වෙත සභාපතිවරයා උපදෙස් ලබා දුන්නේය.

එමෙන්ම, ව්‍යාජ ස්ටිකර් අලවා ඇති මත්පැන් බෝතල් හඳුනා ගැනිම සඳහා සිදුකළ වැටලීම් වල තොරතුරු මෙන්ම අත්අඩංගුවට ගත් ව්‍යාජ මත්පැන් බෝතල් නිෂ්පාදනය කළ හා අලෙවි කළ පුද්ගලයන් සම්බන්ධයෙන් 2023 සැප්තැම්බර් 15 වැනිදාට පෙර කටයුතු කරන ලෙස සභාපතිවරයා නිලධාරීන් වෙත දැනුම් දුන්නේය.

එසේම උක්ත ස්ටිකරය සම්බන්ධයෙන් පවතින නීති රෙගුලාසි පිළිබඳ විමසු කාරක සභාව සමාගම් කිහිපයක් පමණක් එම ස්ටිකරය භාවිත නොකිරීමට නීතියේ ඇති ප්‍රතිපාදන නිවැරදි කර සියලු සමාගම් නිෂ්පාදනය කරන මත්පැන් බෝතල්වල ස්ටිකර් ඇලවීම අනිවාර්ය කරන ලෙස ද සභාපතිවරයා සුරාබදු දෙපාර්තමේන්තුවට උපදෙස් ලබා දුන්නේය.




එමෙන් ම ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවට අයවිය යුතු බිලියන 7ක හිඟ මුදල් මෙම වර්ෂයට හා පෙර වර්ෂවලට අදාළව හිඟ බදු මුදල් අයකර ගැනීමට සැලසුම ඔක්තෝම්බර් මස 30 වන දිනට පෙර කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස ද සභාපතිවරයා ශ්‍රී ලංකා සුරා බදු දෙපාර්තමේන්තුවේ නිළධාරීන් වෙත දැනුම් දුන්නේය.
එමෙන්ම සුරාබදු දෙපාර්තමේන්තුව විසින් නුවරඑළිය ප්‍රදේශයේ සිදු කරන ලද වැටලීම් සම්බන්ධවද මෙහිදී සාකච්ඡා කෙරිණි.


පාර්ලිමේන්තු
ඡායා ගැලරිය


















මෙවර සටහන - එච්. ඊ. ජනකාන්ත සිල්වා - අධ්‍යක්ෂ (ව්‍යවස්ථාදායක සේවා) / අධ්‍යක්ෂ (සන්නිවේදන) (වැඩබලන)

**අගෝස්තු 08 අඟහරුවාදා**

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(3) සහ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල 55(2)(ඇ) ප්‍රකාරව "ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන)", "ප්‍රාදේශීය සභා (සංශෝධන)", "නගර සභා (සංශෝධන)" සහ "මහ නගර සභා (සංශෝධන)" නමැති පනත් කෙටුම්පත් හතර සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණ කථානායකවරයා විසින් පාර්ලිමේන්තුවට වෙන් වෙන් වශයෙන් දැනුම් දීම

- "අධිකරණයකට, විනිශ්චය අධිකාරයකට හෝ ආයතනයකට අපහාස කිරීම" නමැති පනත් කෙටුම්පත අභියෝගයට ලක් කරමින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 ප්‍රකාරව ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කරන ලද පෙත්සමක පිටපතක් කථානායකවරයාට ලැබුණු බව පාර්ලිමේන්තුවට දැනුම්දීම

- මතු සඳහන් පනත් කෙටුම්පත් පාර්ලිමේන්තුවට පිළිගන්වන ලදී:"

(අ) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා "දේශීය ආදායම් (සංශෝධන)";

(ආ) 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත සංශෝධනය කිරීම සඳහා "සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන)";

(ඇ) ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකු භාරය යනුවෙන් හඳුන්වනු ලබන භාරයක් පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; අක්ෂි ශල්‍යකර්ම සඳහා ද විද්‍යාත්මක සහ තාක්ෂණික පර්යේෂණ හා අධ්‍යාපනය සඳහා ද අවශ්‍ය කුණීත, කෘතිම උපාංග සහ අනෙකුත් පටක සැපයීම පිණිස ද; අක්ෂි ශල්‍යකර්ම සඳහා අවශ්‍ය කුණීත හා වෙනත් පටකවල අතිරික්තය වෙනත් රටවල් සමඟ බෙදා ගැනීම පිණිස ද; ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස "ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකු භාර";

(ඈ) (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා "සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන)";

(ඉ) මැතිවරණ පෙත්සමක් ඉදිරිපත් කිරීම සඳහා වූ කාලසීමාව දීර්ඝ කිරීම සඳහා සහ දඩ මුදල් වැඩි කිරීම සඳහා ද; (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත, 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත, 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම පිළිබඳ පනත සහ 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත සංශෝධනය කිරීම සඳහා ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම පිණිස "මැතිවරණ (විශේෂ විධිවිධාන)"; සහ

(ඊ) නීතිඥ වෘත්තියෙහි විශිෂ්ටත්වය සහ උත්කෘෂ්ට තත්ත්වයන් ප්‍රදර්ශනයකොට ඇති උපදේශන නීතිඥවරයන් වශයෙන් වෘත්තියෙහි නිරත වන නීතිඥවරයන් විසින් සපයනු ලබන සේවාව පිළිගැනීමේ සහ අගය කිරීමේ අදහසින් යුක්තව, ජ්‍යෙෂ්ඨ උපදේශන නීතිඥ බහුමානය ප්‍රදානය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස "ජ්‍යෙෂ්ඨ උපදේශන නීතිඥ බහුමානය ප්‍රදානය කිරීමේ"

- "දූෂණ විරෝධී" සහ "අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ" නමැති පනත් කෙටුම්පත් ද්විත්වය පිළිවෙළින් 2023 අංක 9 සහ 10 දරන පනත් වශයෙන් කථානායක ගරු මහින්ද යාපා

අගෝස්තු 09 බදාදා

- ජාතික උරුමයන් සුරැකීම උදෙසා ක්‍රියාත්මක වීම පිණිස පාර්ලිමේන්තු සංසදය ස්ථාපිත කිරීම
- "ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන)" පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් සහ "විසර්ජන (සංශෝධන)" පනත් කෙටුම්පත සංශෝධන රහිතව දෙවැනි වර සහ තුන්වැනි වර කියවා පාර්ලිමේන්තුව විසින් යථා පරිදි සම්මත කරනු ලැබීම

**අගෝස්තු 09 බදාදා**

- ජාතික උරුමයන් සුරැකීම උදෙසා ක්‍රියාත්මක වීම පිණිස පාර්ලිමේන්තු සංසදය ස්ථාපිත කිරීම
- "ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන)" පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් සහ "විසර්ජන (සංශෝධන)" පනත් කෙටුම්පත සංශෝධන රහිතව දෙවැනි වර සහ තුන්වැනි වර කියවා පාර්ලිමේන්තුව විසින් යථා පරිදි සම්මත කරනු ලැබීම

- 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ ධීවර අමාත්‍යවරයා විසින් සාදන නියෝග පහක් පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලැබීම
- ශ්‍රී ලංකා බදුකරණ කාර්යායතනය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවේ වාර්තාව සලකා බලා සංශෝධිතාකාරයෙන් තුන්වැනි වර කියවා පාර්ලිමේන්තුව විසින් යථා පරිදි සම්මත කරනු ලැබීම

අගෝස්තු 10 බ්‍රහස්පතින්දා

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(3) සහ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල 55(2)(ඇ) ප්‍රකාරව "ආයුර්වේද (සංශෝධන)" නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය කථානායකවරයා විසින් පාර්ලිමේන්තුවට දැනුම් දීම

**අගෝස්තු 11 සිකුරාදා**

මතු සඳහන් පෞද්ගලික මන්ත්‍රී යෝජනා විවාද කිරීම සිදු විය:-

(අ) ගරු චමින්ද විජේසිරි මහතා"පළාත් පාලන ආයතනවල කසළ බැහැර කිරීම

(ආ) ගරු බුද්ධික පතිරණ මහතා"රාවණා රජු පිළිබඳ විධිමත් ගවේෂණයක් සිදු කිරීම

අගෝස්තු 21 සඳුදා

ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන), විසර්ජන (සංශෝධන) ආණ්ඩුවේ පනත් කෙටුම්පත් දිවිත්වය සහ ශ්‍රී ලංකා බදුකරණ කාර්යායතනය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත පිළිවෙළින් 2023 අංක 11, 12 සහ 13 පනත් වශයෙන් කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස-ථාව ප්‍රකාරව සහතිකය සටහන් කිරීම

**අගෝස්තු 23 බදාදා**

- "දේශීය ආදායම් (සංශෝධන)" නමැති පනත් කෙටුම්පත අභියෝගයට ලක් කරමින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 ප්‍රකාරව ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කරන ලද පෙත්සමක පිටපතක් කථානායකවරයාට ලැබුණු බව පාර්ලිමේන්තුවට දැනුම්දීම
- 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ මුදල්▫ ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් සාදන ලද රෙගුලාසි ද;
- 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ▫ සෙස් බද්ද සම්බන්ධයෙන් ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලද නියමයද;
- 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව විමසා▫ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝගද;
- 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ වෙල්කම්හොටෙල්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් සම්බන්ධයෙන් ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලද නියමයද

පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලැබීම

**අගෝස්තු 23 බදාදා**

- "දේශීය ආදායම් (සංශෝධන)" නමැති පනත් කෙටුම්පත අභියෝගයට ලක් කරමින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 ප්‍රකාරව ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කරන ලද පෙත්සමක පිටපතක් කථානායකවරයාට ලැබුණු බව පාර්ලිමේන්තුවට දැනුම්දීම
- 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් සාදන ලද රෙගුලාසි ද;
- 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ, සෙස් බද්ද සම්බන්ධයෙන් ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලද නියමයද;
- 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව විමසා, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝගද;
- 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ වෙල්කම්හොටෙල්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් සම්බන්ධයෙන් ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලද නියමයද

පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලැබීම

**අගෝස්තු 24 බ_ හස්පතින්දා**

1979 අංක 61 දරන අත්‍යාවශ්‍ය මහජන සේවා පනතේ 2 වගන්තිය ප්‍රකාරව 2023 අගෝස්තු 17 දිනැති අංක 2345/57 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ ජනාධිපතිවරයා විසින් පළ කරන ලද ප්‍රකාශනය පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලැබීම

අගෝස්තු 25 සිකුරාදා

අභාවප්‍රාප්ත ගරු එස්. ඒ. ආර්. මද්දුමබණ්ඩාර, ගරු බී. සිරිසේන කුරේ සහ ගරු (පූජ්‍ය) උඩවත්තේ නන්ද හිමි යන හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ශෝක යෝජනා ඉදිරිපත් කරනු ලැබීම


# පාර්ලිමේන්තු විත්ති

**පුවත් හසුන I 38 වැනි කාණ්ඩය I 2023 අගෝස්තු**

**ISSN 2806 – 5425**

**සන්නිවේදන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.**

www.parliament.lk

Parliament of Sri Lanka

@ParliamentLK

@slparliament

Parliament of Sri Lanka